# 2014

# වාර්ෂික වාර්තාව

EDB

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2016-05-10

ගරු මලික් සමරවික්‍රම
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය,
සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය,
6 වෙනි මහළ, බටහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
කොළඹ 01.

ගරු ඇමතිතුමනි,

**වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය - 2014**

1971 අංක 38 දරණ මුදල් පනතේ 13(2) වගන්තියේ විධිවිධාන ප්‍රකාර ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2014 වසර සඳහා වන වාර්ෂික වාර්තාව සහ පහත සඳහන් ලියකියවිලි ඔබ වෙත සතුටින් පිළිගන්වමි.

- **සභාපතිනියගේ වාර්තාව**
- **ගිණුම් ප්‍රකාශය**
- **විගණකාධිපතිගේ වාර්තාව**

මෙයට- විශ්වාසී

ඉන්දිරා මල්වත්ත
සභාපතිනිය සහ ප්‍රධාන විධායක

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

# <u>ඖෂධ කළමණාකරණ කාර්ය මණ්ඩලය 2014</u>

| | | |
|---|---|---|
| සභාපති සහ ප්‍රධාන විධායක | - | බන්දුල එගොඩගේ මහතා |
| අධ්‍යක්ෂ ජනරාල් | – | ඩබ්. එස් . ඩී .එස් . වීරකෝන් මිය |
| විධායක අධ්‍යක්ෂ | – | ආචාර්ය යූසුෆ් කේ. මරික්කාර් මහතා |
| මුදල් හා පාලන අංශය | – | ආර්. එම් . පී. හේවාලියනගේ මෙය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| අපනයන අලෙවි සංවර්ධන අංශය | – | ජේ. සිරිවර්ධන මිය<br>අතිරේක අධ්‍යක්ෂ ජනරාල් |
| මූල්‍ය අංශය | – | පී. කේ. සුමිත්‍රාරච්චි මිය<br>අධ්‍යක්ෂිකා |
| මානව සම්පත් කළමණාකරණ අංශය | – | ඒ. ජී. සී. කිරිඇල්ල මිය<br>අධ්‍යක්ෂිකා |
| වෙළඳ පහසුකම් හා වෙළඳ තොරතුරු අංශය | – | එස්. ආර්. පී. ඉන්ද්‍රකීර්ති මහතා<br>අධ්‍යක්ෂ |
| තොරතුරු තාක්ෂණ අංශය | – | පී. වී. ඒ. එම්. බද්දේගමගේ මිය<br>අධ්‍යක්ෂිකා |
| කෘෂි අපනයන අංශය | – | ආචාර්ය එම්. එල්. ඒ. සමරප්පුලි මිය<br>අධ්‍යක්ෂිකා |
| සුළු හා මධ්‍යම ව්‍යවසාය සංවර්ධන අංශය | – | කේ. එච්. ආර්. පී. ප්‍රනාන්දු මහතා<br>වැ.බ. අධ්‍යක්ෂ |
| ප්‍රතිපත්ති හා සැලසුම් අංශය | – | දයානි වැගපිටිය මිය<br>අධ්‍යක්ෂිකා |
| කාර්මික නිෂ්පාදන අංශය | – | සී. දිසානායක මෙය<br>අධ්‍යක්ෂිකා |
| අපනයන සේවා අංශය | – | එම් .කේ. එස්. කේ. මල්දෙනිය මහතා<br>අධ්‍යක්ෂ |

| | | |
|---|---|---|
| විශේෂ ව්‍යාපෘති අංශය | – | ඩී . ජයවර්ධන මහතා<br>අධ්‍යක්ෂ |
| අලෙවි සංවර්ධන අංශය | – | අයි. සී. අලහප්පෙරුම මිය<br>වැ.බ. අධ්‍යක්ෂිකා |
| අභ්‍යන්තර විගණන අංශය | – | එන්. පී. ඇඳගම මිය<br>වැ.බ. අභ්‍යන්තර විගණක |
| නීති අංශය | – | ඩී.ටී. විජයරත්න මිය<br>නීති නිළධාරිනී |
| විගණකවරු | – | විගණකාධිපති |
| බැංකු කරුවන් | – | ලංකා බැංකුව |
| | – | සම්පත් බැංකුව |
| | – | ජාතික සංවර්ධන බැංකුව |

**<u>ලියාපදිංචි කාර්යාලය</u>**

අංක 42 ,නවම් මාවත

කොළඹ 02.

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් - 2014

| | | |
|---|---|---|
| 01 | බන්දුල එගොඩගේ මහතා | - සභාපති |
| 02 | යූසුෆ් කේ.මරික්කාර් මහතා | - අධ්‍යක්ෂ |
| 03 | නවාස් රාජබ්දීන් මහතා | - අධ්‍යක්ෂ |
| 04 | ෂරාෆ් එම්.සුහයිබ් මහතා | - අධ්‍යක්ෂ |
| 05 | රොහාන්ත එන්.ඒ.අතුකෝරාල මහතා | - අධ්‍යක්ෂ |
| 06 | සී.සී.වයි.අබේවර්ධන මහතා | - අධ්‍යක්ෂ |
| 07 | එස්.අලම්දීන් මහතා | - අධ්‍යක්ෂ |
| 08 | අනුරාධ විජේකෝන් මහතා | - අතිරේක ලේකම්<br>වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය |
| 09 | ඒ.කේ.සෙනෙවිරත්න මහතා | - අතිරේක ලේකම්<br>කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය |
| 10 | අසෝක සිරිවර්ධන මහතා | - අතිරේක ලේකම්<br>කෘෂිකර්ම අමාත්‍යාංශය |
| 11 | යූ.කේ.එස්.මිහිඳුකුලසූරිය මහතා | - අතිරේක ලේකම්<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2014 මැයි දක්වා) |
| 12 | ඒ.දමිතා එන්. ද සොයිසා මෙනවිය | - ලේකම්<br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (2014 ජූලි සිට) |
| 13 | ඩී.එම්.ආර්.දිසානායක මහතා | - ලේකම්<br>ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය |
| 14 | කේ.එම්.එම්.සිරිවර්ධන මහතා | - අධ්‍යක්ෂ ජනරාල්<br>රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව<br>මූල්‍ය සහ ප්‍රතිපත්ති සම්පාදන අමාත්‍යාංශය |
| 15 | වී.සිවඥානසෝති මහතා | - ලේකම්<br>සාම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය |
| 16 | සංජීව වික්‍රමනායක මහතා | - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික<br>ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය |
| 17 | ජී.කේ.ඩී. අමරවර්ධන | - ලේකම්<br>සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය |

# පටුන


| | | |
|---|---|---|
| 01 | හැඳින්වීම | 7 |
| 02 | 2014 වර්ෂයේ අපනයන කාර්යය සාධනය | 8-18 |
| 03 | 2014.12.31 දිනට ශේෂ පත්‍රය | 19 |
| 04 | 2014.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය | 20 |
| 05 | මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 21 |
| 06 | හිමිකම් ප්‍රකාශය | 22 |
| 07 | මූල්‍ය ප්‍රකාශන සටහන් | 23-30 |
| 08 | විගණන වාර්තාව | 31-51 |

# ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

1979 අංක 40 දරණ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අපනයන සංවර්ධනය සහ ප්‍රවර්ධනයේ නියැලී ප්‍රධානතම රාජ්‍ය ආයතනයයි.

**අපගේ ඉදිරි දැක්ම**

අපගේ ප්‍රධාන අපනයන භාණ්ඩ හා සේවාවන් සඳහා අන්තර්ජාතික ගැණුම්කරුවන් අතර ප්‍රමුඛතම සැපයුම්කරු බවට ශ්‍රී ලංකාව පත් කිරීම.

**අපගේ මෙහෙවර**

භාණ්ඩ හා සේවා අපනයනය සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය පත් කිරීම, ශ්‍රී ලංකාවේ අපනයනයන්ගේ ජාත්‍යන්තර තරගකාරීත්වය ඉහළ නැංවීම, භාණ්ඩ හා සේවා අපනයනයෙන් උපරිම විදේශ විනිමයක් උපයා ගැනීමට කටයුතු කිරීම සහ රජයේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට උපරිමව දායක වීම.

**අපගේ අරමුණු**


1. "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" අපේක්ෂිත ආර්ථික සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි ශ්‍රී ලංකාවේ අපනයන ආදායම වර්ෂ 2020 දී ඇ.ඩොලර් බිලියන 20 දක්වා ඉහළ නැංවීම.
2. යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපද වෙළඳපල වලට කරනු ලබන ශ්‍රී ලංකාවේ අපනයන ස්ථාවරව පවත්වා ගන්නා අතරතුර, අනිකුත් විදේශ වෙළඳපල වලට කරනු ලබන අපනයන, සමස්ත අපනයන ඉපැයුමෙන් 50% ට වඩා වැඩි මට්ටමකට ඉහළ නැංවීම.
3. ශ්‍රී ලංකාවේ මුළු අපනයන ආදායමට 80% ක් පමණ දායක කරනු ලබන හඳුනාගත් ප්‍රමුඛ භාණ්ඩ හත (07) පිළිබද විශේෂ අවධානය යොමු කරමින්, ඒවායේ අපනයන ආදායම සැලකිය යුතු ලෙස වැඩි කිරීම.
4. ඒකාබද්ධ අලෙවි සන්නිවේදන වැඩ සටහනක් තුලින්, ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ හා සේවා පිළිබඳව ධනාත්මක ප්‍රතිරූපයක් අන්තර්ජාතිකව ඇති කිරීම.
5. අපනයන වෙළඳාමේ ප්‍රතිලාභ, එම ක්ෂේත්‍රයේ නියැලී සියලු පාර්ශවයන්ටම සහ දිවයිනේ සෑම පළාතකටම ගලා යාමට සැලැස්වීම.
6. සේවක ඵලදායිතාව සහ කැපවීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින්, ආයතනයේ මූලික වටිනාකම් මත ගොනු වූ විශිෂ්ට කණ්ඩායමක් මණ්ඩලය තුළ බිහි කිරීම.

# 2014 ජනවාරි - දෙසැම්බර් කාලය තුල ප්‍රගතිය

**හැඳින්වීම**

ශ්‍රී ලංකාවේ සංවර්ධනය සහ ප්‍රවර්ධනයේ නියැළි ප්‍රධානතම රාජ්‍ය ආයතනය වන අපනයන සංවර්ධන මණ්ඩලය, තම වගකීම් ඉටු කිරීමේ කාර්යභාරය සහ විෂය පථය පැහැදිලිව හඳුනාගෙන ඇත. 2014 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා අපනයන සංවර්ධන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය පහත දැක්වේ.

**ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල අපනයන ප්‍රගතිය**




මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගුව

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන සහ තොරතුරු තාක්ෂණ සේවා අපනයන ආදායම 2014 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුල ඇමරිකානු ඩොලර් මිලියන 11,**87**8 ක් උපයා ගනු ලැබූ අතර එය 2013 වසරේ අදාල කාලය තුල උපයන ලද ඇමරිකානු ඩොලර් මිලියන 11,113 හා සසඳන විට 6.88% කින් වර්ධනය වී ඇත.

ප්‍රධාන අපනයන ක්ෂේත්‍රයන් වන කෘෂි, ධීවර සහ කාර්මික අපනයනයන් පිළිවෙලින් සමස්ථ අපනයන ආදායමට 22.72%, 2.23% සහ 67.92% ආදි වශයෙන් පිළිවෙලින් ධන වර්ධනයන් දක්නට ලැබිණ.

2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල කෘෂි අපනයන ක්ෂේත්‍රයේ ධන වර්ධනය, තේ (5.43%) , රබර් (5.43%), එළවළු (25.78%), පලතුරු (51.80%), කැපූ මල් හා විසිතුරු පැල (4.87%) සහ නිස්සාරක තෙල් (26.08%) යන අංශයන්ගේ ධන වර්ධනය හේතු විය. අදාල කාලය තුල පොල් ආශ්‍රිත නිෂ්පාදන (-36.1%) සහ කුළු බඩු (-28.90%) අපනයනයන්ගේ අඩුවීමක් දක්නට ලැබිණ.

ධීවර අපනයන ක්ෂේත්‍රයේ සියලුම අංශයන් එනම්, විසිතුරු මසුන් (17.09%), ක්‍රස්ටේෂියන්ස් (23.93%) සහ මුහුදු ආහාර (13.72%) යනාදී ලෙස වර්ධනයක් පෙන්වන ලදී. කාර්මික අපනයන ක්ෂේත්‍රයේ, සමස්ත අපනයන ආදායමට 41.32% ක දායකත්වයක් දක්වන රෙදිපිළි සහ ඇඟළුම් අපනයන ආදායම 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලය තුල 9.23% ධන වර්ධනයක් වාර්තා කරන ලදී.

අදාල කාලය තුල සකස්කළ ආහාර පාන, දුම්කොළ (13.96%), සම් සහ සම් ආශ්‍රිත නිෂ්පාදන (6.22%), කඩදාසි නිෂ්පාදන (10.01%) , රබර් ආශ්‍රිත නිෂ්පාදන (0.22%) , රසායනික නිෂ්පාදන (40.25%), ප්ලාස්ටික් නිෂ්පාදන (17.27%), ඛනිජ නිෂ්පාදන (5.2%), ලුහු ඉංජිනේරු නිෂ්පාදන (5.17%). ඉලෙක්ට්‍රික් සහ ඉලෙක්ට්‍රොනික නිෂ්පාදන (9.95%), ප්‍රවාහන උපාංග සහ කොටස් (13.08%), බෝට්ටු නිෂ්පාදන (5.19%) සහ පාවහන් (195.73%) යනාදි ක්ෂේත්‍රයන්ගේ ධන වර්ධනයන් වාර්තා කරන ලදී. නමුත් දියමන්ති, මැණික් සහ ආභරණ (-12.85%) සහ පෙට්‍රෝලියම් නිෂ්පාදන (-21.03%) අපනයනයන් අදාල කාලය තුල ඍන වර්ධනයන් වාර්තා කරන ලදී.

සමස්ත අපනයන ආදායමෙන් පිළිවෙලින් 31.35% ක් හා 24.43% ක් අවශෝෂනය කරගන්නා අපගේ ප්‍රධාන වෙළඳපලවල් වන යුරෝපා සංගමය සහ ඇමරිකානු එක්සත් ජනපදය 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල 6.43% ක් සහ 9.14% යනාදී ලෙස ධන වර්ධනයන් වාර්තා කරන ලදී.


**2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන සංවර්ධන වැඩ සටහන් වල ප්‍රගතිය**

- **උපාය මාර්ගික සැලැස්ම 2015 - 2020**

අපනයන සංවර්ධන මණ්ඩලය 2015 - 2020 කාලය සඳහා අපනයන සංවර්ධන කාර්යයේ නිරත වන රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් දෙකේම උපදේශකත්වයෙන් සහ සහභාගීත්වයෙන් නව උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට ආරම්භ කරන ලදී. මේ සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය US/AID හි VEGA FEG ශ්‍රී ලංකා ව්‍යාපෘතිය මගින් මූල්‍යමය සහනයක් ලබාගත් අතර MTI Consulting ආයතනය මගින් උපදේශකත්වය ලබාගන්නා ලදී.

- **ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්ම (NES)**

අපනයන සංවර්ධන මණ්ඩලය 2015 - 2020 කාලය සඳහා අපනයන සංවර්ධන කාර්යයේ නිරත වන රාජ්‍ය සහ පෞද්ගලික අංශයන් දෙකේම උපදේශකත්වයෙන් සහ සහභාගීත්වයෙන් ජාතික අපනයන උපාය මාර්ගික සැලැස්මක් සකස් කිරීමට ආරම්භ කරන ලදී.





අපනයන සංවර්ධන මණ්ඩලය මේ සඳහා තාක්ෂණික සහය ජිනීවා හි අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානය (ITC) මගින් ලබාගත් අතර පසුගිය අගෝස්තු මස ශ්‍රී ලංකාවට ජිනීවා හි අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානයෙන් (ITC) මෙහි මූලික වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා නියෝජිතයින් දෙදෙනෙකු පැමිණි අතර මූලික උපදේශක කටයුතු අදාල පාර්ශවයන් සමග සිදු කරන ලදී.

- **උපදේශක සභා**

අපනයන සංවර්ධන පනත යටතේ අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පිහිටුවන ලද උපදේශක සභා 26 මගින් රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකේම සහභාගීත්වය ශක්තිමත් කරමින් අපනයන වෙළඳාමට පහසුකම් සැපයේ. මෙම උපදේශක සභා උද්‍යෝගිව අපනයන සංවර්ධන මණ්ඩලය සමඟ නිරන්තර ක්‍රියාකාරකම්හි නිරත වේ.

- **"බෙන්ච්මාර්ක්" වැඩ සටහන - ප්‍රගති වර්ධනයට ප්‍රවේශයක්**



2012 වසරේදී ජිනීවා හි අන්තර්ජාතික වෙළඳ මධ්‍යස්ථානයෙන් (ITC), ලෝකයේ වෙළඳ ප්‍රවර්ධනයේ සහය දෙන ආයතනයන්ගේ (TPO) ඵලදායිතාවය සහ කාර්යක්ෂමතාවය ඇගයීම සඳහා සිදු කරන ලද "බෙන්ච්මාර්කින්" වැඩ සටහනේ ප්‍රතිඵලයක් ලෙස පසුගිය ජූලි මස සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ජිනීවා සිට පැමිණ අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා ප්‍රගති වර්ධන ප්‍රවේශයක් සැකසීම (PIRM) පිළිබඳ වැඩ සටහන් පවත්වන ලදී.

- **ව්‍යවසායකයන්ගේ ගැටළු විසඳීම**





ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් අපනයන සංසදය පැවැත් වූ අතර අපනයන ක්ෂේත්‍රය හා අදාල ගැටළු 53 ක් පමණ මෙහිදී සාකච්ඡා කරන ලදී.

- **වෙළඳපල සංවර්ධන සහ ප්‍රවර්ධන වැඩ සටහන්**

අදාල කාලය තුල අපනයන සංවර්ධන මණ්ඩලය පහත දැක්වෙන අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනයන්හි ශ්‍රී ලංකා වෙළඳ මණ්ඩපයන් සංවිධානය කරන ලදී.

**යුරෝපා කලාපය** : අලිමන්ටේරියා, බාසිලෝනා, ස්පාඤ්ඤය ( අපනයනකරුවන් 05 යි), සී ෆුඩ් එක්ස්පෝ ග්ලෝබල්, බෙල්ජියම ( අපනයන කරුවන් 05 යි ), සියල්, කැනඩාව (අපනයන කරුවන් 05 යි), ඉන්ටර්සූ, ජර්මනිය (අපනයන කරුවන් 07 යි), පේපර් වර්ල්ඩ්, ජර්මනිය (අපනයන කරුවන් 03 යි)

**ඇමරිකානු කලාපය** : ඇමරිකා නිව් ඕලියන්ස් හි IFT වෙළඳ ප්‍රදර්ශනය (අපනයන කරුවන් 02 යි)

**ආසියානු කලාපය** : ෆුඩෙක්ස්, ජපානය (අපනයන කරුවන් 04 යි), ඉන්ටර්නැෂනල් හෝටිකල්චර්, කොරියාව (අපනයන කරුවන් 06 යි), ජපානයේ IT Week (අපනයන කරුවන් 04 යි), චීනයේ කුන්මිං හි දෙවන දකුණු ආසියානු ප්‍රදර්ශනය (අපනයන කරුවන් 120 යි), ඉන්දියා අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශනය (අපනයනකරුවන් 5)

**මැද පෙරදිග, CIS, අප්‍රිකානු කලාපය** : ගල්ෆ් ෆුඩ්, එක්සත් අරාබි එමීරය (අපනයන කරුවන් 23 යි), සයිටෙක්ස්, දකුනු අප්‍රිකාව (අපනයන කරුවන් 12 යි)

- **ව්‍යාපාර ප්‍රවර්ධන දූත මෙහෙවර**

**බාහිර ගැනුම්කරු විකුණුම්කරු හමු** - මියන්මාරයට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියුතු 18 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, බහරේනයට 20 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, ඊශ්‍රායලයට 20 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, ටියුනීසියාවට 03 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, ඉන්දියාවට 05 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, මාලදිවයිනට 15 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, බ්‍රසීලයට ඇඟළුම් ක්ෂේත්‍රයේ නියුතු 09 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, මාලදිවයිනට අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතු 23 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්.

- **අභ්‍යන්තර ගැනුම්කරු විකුණුම්කරු හමු**

මාලදිවයිනෙන් නියෝජිත පිරිසක්, චීනයෙන් නීරෝධායන සේවාවන් ආශ්‍රිත නියෝජිත පිරිසක්, චීනයේ ෆුජියාන් පළාතෙන් 20 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, චීනයෙන් 03 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, සිංගප්පූරුවෙන් 02 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, සී ෂෙල්ස් 04 දෙනෙකුගෙන් සමන්විත නියෝජිත මණ්ඩලයක්, ඊජිප්තුවෙන් සහ පෝලන්තයෙන් නියෝජිත පිරිස්.

- **වෙළඳපල පර්යේෂණ**

අපනයන සංවර්ධන මණ්ඩලය, විශාල අපනයන වෙළඳපල කිහිපයක් මත රැඳියාව අවමකර අපනයන වෙළඳපල විවිධාංගීකරණය කිරීමේ අරමුණින් බ්‍රසීලය, දකුණු අප්‍රිකාව, චීනය ආදි රටවල වෙළඳපල පර්යේෂණ අධ්‍යාවනයන් සිදුකරන ලදී.

BRICS කලාපයේ සාමාජික රටවල් වන බ්‍රසීලය සහ දකුණු අප්‍රිකාව ඉහළ ආර්ථික වර්ධනයක් පෙන්වන රටවල් ලෙස හඳුනාගෙන ඇති අතර ඒවා සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලාංකීය අපනයනකරුවන් සඳහා වෙළඳපල ගවේෂණ චාරිකාවන් කිහිපයක් සිදු කරන ලදී.

අපනයන සංවර්ධන මණ්ඩලය, ඇඟළුම් කරුවන්ගේ සංසදය බ්‍රසීලයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය හා එක්ව බ්‍රසීලයට ප්‍රධාන ඇඟළුම් සමාගම් 07 ක් හා සුළු හා මධ්‍ය ව්‍යවසා 05 ක් ඇතුළු පළමු ශ්‍රී ලාංකීය ඇඟළුම් ප්‍රවර්ධන දූත මෙහෙය සිදු කරන ලදී.

**දේශිය වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම**

- අන්තර්ජාතික මැණික් සහ ආභරණ ප්‍රදර්ශනය ( FACETS 2014)
- පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය

**කෘෂිකාර්මික නිෂ්පාදන, ධීවර නිෂ්පාදන, කාර්මික නිෂ්පාදන සහ අපනයන සේවා සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්**

**ශ්‍රී ලංකා කුරුඳු සන්නම්කරණය**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පිරිසිදු ශ්‍රී ලංකා කුරුඳු අන්තර්ජාතික සන්නම් නාමයක් ලෙස අන්තර්ජාතික වෙළඳපලට හඳුන්වා දෙන ලදී. ඇමරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය, කොලොම්බියා සහ පේරු යනාදී රටවල මෙම වෙළඳ ලකුණ ලියාපදිංචි කරන ලදී. එමෙන්ම එය ලෝක බුද්ධිමය දේපල කාර්යාංශයේ ද ලියාපදිංචි කරන ලදී.

යුරෝපා වෙළඳපලේ ශ්‍රී ලංකා කුරුඳු සඳහා භූගෝලීය දර්ශකය ලබා ගැනීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය කටයුතු කරමින් සිටී.

Pure Ceylon Cinnamon **වෙළඳ ලකුණ භාවිතයේ අයිතිය ලබාදීමේ වැඩ සටහන**



අපනයන සංවර්ධන මණ්ඩලය සුදුසුකම්ලත් අපනයනකරුවන් 13 දෙනෙකු සඳහා තම අගය එකතු කරන ලද කුරුඳු අපනයනයේදී මෙම වෙළඳ ලකුණ භාවිතා කිරීම සඳහා බලපත්‍ර නිකුත් කරන ලදී.

**ජාතික කාබනික තත්ත්ව ඒකකය පිහිටුවීම**

කාබනික කෘෂි නිෂ්පාදන අපනයනය සහ ආනයනය පාලනය කිරීම සඳහා ස්වාධීන ජාතික ආයතනයක් ලෙස ජාතික කාබනික තත්ත්ව ඒකකය පිහිටුවන ලදී. මෙමගින් අන්තර්ජාතික වෙළඳපලේ කාබනික කෘෂි නිෂ්පාදනයන් හි විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම මෙන්ම ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන නිෂ්පාදනයන් හි තත්ත්වය සහ ආරක්ෂාව සහතික කිරීමත් කරනු ලැබේ.

සියලුම කාබනික කෘෂි නිෂ්පාදන ක්ෂේත්‍රයේ නිරතවන නිෂ්පාදකයන්, සකසන්නන් සහ අපනයනකරුවන්/ආනයනකරුවන් මෙම කාබනික තත්ත්ව ඒකකයේ ලියාපදිංචි විය යුතු අතර, කාබනික තත්ත්වයන්ට අනුකූල විය යුතුය. එමෙන්ම නිෂ්පාදනයන් සඳහා කාබනික ලේබලය ඇතුලත් කිරීම සඳහා අන්තර්ජාතික වශයෙන් පිළිගත් සහතිකකරණ ආයතනයකින් සහතිකයක් ලබා ගත යුතුයි.

**කෘෂි අපනයන කලාප**

අපනයනය සඳහා කෘෂි නිෂ්පාදන සැපයුම් සංවර්ධනය සහ ග්‍රාමීය ප්‍රජාවට අපනයනයේ ප්‍රතිලාභ ලබා දීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය කෘෂි අපනයන කලාපයන් පිහිටුවන ලදී. දකුණු පලාතේ කුරුඳු තලන්නන්ගේ තත්ත්ව ප්‍රමිතීන් ඉහළ නැංවීම සඳහා කුරුඳු ක්ෂේත්‍රයේ සෞඛ්‍යාරක්ෂිත නිෂ්පාදන ක්‍රම (GMP) සහිත මධ්‍යස්ථාන 15ක් පිහිටුවන ලදී.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ විසිතුරු මසුන් අභිජනනය සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. 2013 හා 2014 වර්ෂයන් හි සිංගප්පූරුවේ පැවති අන්තර්ජාතික විසිතුරු මත්ස්‍ය තරඟයන්හි දී පොලොන්නරුව කෘෂි කලාපයේ විසිතුරු මත්ස්‍ය අභිජනකයින් අන්තර්ජාතික මට්ටමේ ජයග්‍රහණ අත් කරගන්නා ලදී.
අම්පාර දිස්ත්‍රික්කයේ කහ වගාකිරීමේ වැඩසටහනක් සහ නැගෙනහිර පලාතේ අන්නාසි වගා කිරීමේ වැඩසටහනක් පිහිටුවන ලදී.

**– විසිතුරු මත්ස්‍ය අපනයන කරුවන් සඳහා නිරෝධායන පහසුකම් සහ රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා සහන ලබා දීමේ වැඩ සටහන.**

අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2013 ජාතික අයවැය මගින් අනුමත වූ විසිතුරු මත්ස්‍ය ක්ෂෙත්‍රයේ නිරෝධායන පහසුකම් සහ රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා මූල්‍ය සහනයක් ලබාදීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී. අදාල කාලය තුල ගිවිසුම් 10ක් අත්සන් කරන ලදී. එමෙන්ම තවත් සමාගම් 04 ක ලියකියවිලි සහ වියදම් ප්‍රතිපූරනය සඳහා ඉදිරිපත් කර තිබේ.

**– ශ්‍රී ලංකා අත්යන්ත්‍ර, ඇඟළුම් ක්ෂේත්‍රය සඳහා මෝස්තර සංවර්ධන වැඩ සටහන**





ශ්‍රී ලංකා අත්යන්ත්‍ර ඇඟළුම් ක්ෂේත්‍රයේ තිරසාර බව රැකගැනීම සඳහා මෝස්තර සහ ප්‍රවර්ධන හැකියාවන් සංවර්ධනය කිරීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය අත්යන්ත්‍ර ක්ෂේත්‍රයේ නියැලි 50 දෙනෙකු සඳහා පසුගිය ජුනි 30 වන දින වැඩමුළුවක් පවත්වන ලදී.

**– බෝට්ටු දැක්ම සහ ධීවර ප්‍රදර්ශනය 2014**

බෝට්ටු නිෂ්පාදන ක්ෂේත්‍රයේ අදාල අංශයන් හි ඍජුව හා වක්‍රව නිරතවන සියලුම ව්‍යවසායකයින් සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ගැණුම්කරුවන්ට ප්‍රදර්ශනය සහ ප්‍රවර්ධනය කිරීම සඳහා එකම වේදිකාවක් සැපයීමේ අරමුණින්, අපනයන සංවර්ධන මණ්ඩලය, බෝට්ටු ඉදිකිරීම් තාක්ෂණ සංවර්ධන ආයතනය සහ ලංකා ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ සේවා පෞද්ගලික සමාගම, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය එක්ව 2014 ඔක්තෝබර් 10-12 දක්වා වත්තල දික්ඕවිට ධීවර වරායේදී මෙම බෝට්ටු ප්‍රදර්ශනය පවත්වන ලදී. මෙවර ප්‍රදර්ශනයේ කැපී පෙනෙන අංගයක් වූයේ පළමු වරට ඉදිරිපත් කරන ලද ජලය මත ප්‍රදර්ශනය කරනු ලැබූ යාත්‍රාවන්ය.

ප්‍රදර්ශන කුටි 65කින් සමන්විත වූ අතර ජලය මත විශාල බෝට්ටු 11ක් සහ භූමියේ 9 ක් ප්‍රදර්ශනය කරන ලදී.

“ශ්‍රී ලංකාවේ සමුද්‍රිය කර්මාන්ත සංවර්ධනය සහ සමුද්‍රිය සංචරණය“ යන මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙහිදී ICOMIA හි කීර්තිමත් දේශකයන් විසින් ශ්‍රී ලංකාවට ප්‍රයෝජනවත්වන සමුද්‍රිය හා ජලය ආශ්‍රිත සංවර්ධනය, සමුද්‍රිය තිරසාරබව සහ තවත් බොහෝ විෂයයන් පිළිබඳ ඔවුන්ගේ අත්දැකීම් හුවමාරු කරන ලදී.

**– අත්කම් නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා සාධාරණ වෙළඳාම (Fair Trade) සංකල්පය හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම**



මෙම වැඩ සටහනේ පළමු අදියර 2013 වසරේදී විදේශිය සාධාරණ වෙළඳාම පිළිබඳ විශේෂඥයෙකුගේ උපදේශකත්වයෙන් ආරම්භ කරන ලදී. දෙවන අදියර යටතේ 2014 වසරේදී මේ සඳහා සමාගම් 09 ක් තෝරාගත් අතර ඔවුන් සාධාරණ වෙළඳ තත්ත්වයන් පිළිබඳ දැනුවත් කරන ලදී.

**ගෝලීය රබර් සම්මේලනය 2014**



2014 ඔක්තෝබර් 27 සිට 30 දක්වා ප්‍රථම වරට ශ්‍රී ලංකාවේදී රබර් නිෂ්පාදන ක්ෂේත්‍රයේ කීර්තිමත් අන්තර්ජාතික පුරෝගාමීන්ගේ සහ ශ්‍රී ලාංකීය රබර් නිෂ්පාදකයන්/අපනයනකරුවන්ගේ හඟාගීත්වයෙන් මෙම ගෝලීය රබර් සම්මේලනය පවත්වන ලදී.

රබර් නිෂ්පාදන ක්ෂේත්‍රයේ නියාමන අධිකාරීන් සහ වාණිජමය ක්‍රියාකරුවන් සඳහා ස්වාභාවික රබර් ක්ෂේත්‍රය මුහුණ දෙන අනාගත අභියෝගතා සහ නව ප්‍රවණතා පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබාදීම, තොරතුරු හුවමාරුව සඳහා පහසුකම් සැලසීම මගින් නව ව්‍යාපාරික අවස්ථාවන් උදා කිරීම හා ඒවා පුළුල් කිරීම,ආසියානු රටවල විශේෂයෙන් ශ්‍රී ලංකාව තුළ රබර් ක්ෂේත්‍රයේ පුළුල් ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීම, ප්‍රතිපත්ති සකසන්නන් සහ සංගම් නායකයින්ට කර්මාන්තයේ තීරණාත්මක සාධක පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වේදිකාවක් සකස් කර දීම සහ රබර් ක්ෂේත්‍රයේ නවතම පර්යේෂණයන්, සංවර්ධනයන්සහ නවෝත්පාදනයන් පිළිබඳ ක්ෂේත්‍රයේ විශේෂඥයින්ට සන්නිවේදනය කිරීම යනාදී ප්‍රධාන අරමුණු පහක් සපුරාගැනීමේ අපේක්ෂාවෙන් මෙම සම්මේලනය පවත්වනු ලැබීය.

### පළමු ශ්‍රී ලාංකීය අන්තර්ජාතික විසිතුරු මත්ස්‍ය කර්මාන්තය පිළිබඳ සම්මේලනය (INFOFISH 2014)




අපනයන සංවර්ධන මණ්ඩලය, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, මැලේසියාවේ INFOFISH ආයතනය, ආසියා පැසිපික් කලාපය සඳහා අලෙවිකරණ තොරතුරු සහ තාක්ෂණ උපදේශන සේවා සඳහා වූ අන්තර් රාජ්‍ය ආයතනය සහ මැලේසියාවේ අන්තර්ජාතික විසිතුරු මත්ස්‍ය ආයතනය (OFI) එක්ව මෙම අන්තර්ජාතික විසිතුරු මත්ස්‍ය කර්මාන්තය පිළිබඳ සම්මේලනය පවත්වන ලදී.

කොළඹ, ගලදාරී හෝටල පරිශ්‍රයේදී මෙම සම්මේලනය උත්සවාකාරයෙන් ආරම්භ කරන ලද අතර මෙමගින් දකුණු ආසියාවේදී අන්තර්ජාතික ධීවර ක්ෂේත්‍රයේ විශේෂඥයින් සහ අපනයනකරුවන් රැසක් ප්‍රථම වරට එකම වෙලාවක දී එකම තැනකදී හමුවීමේ අවස්ථාවක් සලසන ලදී.

විසිතුරු මත්ස්‍ය වෙළඳපල තත්ත්වය සහ සැපයුම සහ දේශීය සහ අන්තර්ජාතික වෙළඳාම හා අදාල වෙළඳ ගැටලු යනාදිය ඉලක්ක කරමින් මෙම සම්මේලනය පවත්වන ලදී.

මෙහිදී විසිතුරු මත්ස්‍ය වගාව සෞඛ්‍යය යනාදී විවිධ උපක්ෂේත්‍රයන්ගේ නූතන දියුණුව පිළිබඳව සාක්ච්ඡා කෙරිණ.

විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ විවිධ උප කොටස් නියෝජනය කරමින් දේශීය හා අන්තර්ජාතික නියෝජිතයන් 300කට අධික පිරිසක් මෙම දෙදින සම්මෙලනය සඳහා සහභාගී විය.

**අපනයන සේවා**

- නෙදර්ලන්තයේ CBI ආයතනයේ විශේෂඥයෙකු තෝරාගත් මෘදුකාංග සමාගම් 07 ක වාරිකාවේ නිරත වූ අතර ඔවුන්ට ව්‍යාපාර අලෙවිකරණ සැලැස්මක් පිළිබඳ උපදේශන ලබාදෙන ලදී.

- තොරතුරු තාක්ෂණ සන්නිවේදන ක්ෂේත්‍රයේ 30 දෙනෙකු සඳහා වෙබ් අඩවි තත්ත්වයෙන් උසස් කිරීම සහ අන්තර්ජාලය හරහා අලෙවිකරණය පිළිබඳ දෙදින වැඩමුළුවක් ජූනි 19 සහ 20 යන දිනයන්හි දී අපනයන සංවර්ධන මණ්ඩලය, නෙදර්ලන්තයේ CBI ආයතනය හා එක්ව පවත්වන ලදී.
- ඉලෙක්ට්‍රොනික් සහ තොරතුරු තාක්ෂණ සන්නිවේදන ක්ෂේත්‍රයේ 84 දෙනෙක් සඳහා Internet of Things යන මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.





- තොරතුරු තාක්ෂණ සන්නිවේදන ක්ෂේත්‍රයේ 80 දෙනෙක් සඳහා Free an Open Source Software (FOSS) යන මැයෙන් සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

Brasil IT+ Value beyond expectations

Egypt on

***Some rival ICT Promotional Logos***

**ශ්‍රී ලංකා මෘදුකාංග සන්නම්කරණය [මූලික වැඩ කටයුතු]**

ශ්‍රී ලංකා මෘදුකාංග සන්නම් ක්‍රියාවලිය සඳහා සුදුසු ක්‍රමයක් සකස් කිරීමට රාජ්‍ය ආයතන, කර්මාන්ත සංගම්, මෘදුකාංග සංවර්ධන සමාගම්, ව්‍යාපාර ක්‍රියාවලි කළමණාකරණය/ දැනුම ක්‍රියාවලි කළමණාකරණය, අධ්‍යාපනය, යටිතල පහසුකම්, ඉංජිනේරු අංශයන් නියෝජනය වන පරිදි සාමාජිකයන් 25 ක ගෙන් සමන්විත කණ්ඩායමක් පිහිටුවන ලදී.
මේ සම්බන්ධයෙන් සමාගම් සඳහා යොමු කරන ලද ප්‍රශ්නාවලියට සමාගම් 62ක් අනුකූලතාවය දක්වන ලදී. ඒ අනුව උපදෙශක සභාව මගින් මේ කාර්යය සඳහා නිර්මාණයක් සහ සන්නම්කරණයට සුදුසු තේමාවක් නිර්දේශ කිරීමට නියමිතය.

- පලාත් මට්ටමින් තොරතුරු සන්නිවේදන තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි කළමණාකරනය කිරීමේ ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නුවර/ගාල්ල/මාතර දිස්ත්‍රික්කවල තොරතුරු තාක්ෂණ සමාගම් 25ක් සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය SLASSCOM හා එක්ව කොළඹ තොරතුරු තාක්ෂණ උද්‍යානයේ (IT Park) හි අධ්‍යයන චාරිකාවක් සහ දැනුම බෙදාගැනීමේ සැසියක් සංවිධානය කරන ලදී.

**ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන්**

අපනයන සංවර්ධනය උදෙසා ග්‍රාමීය සම්පත් හා හැකියාවන් දායක කර ගැනීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රාදේශීය ශාඛා ජාලය මගින් අදාල කාලය තුල ක්‍රියාත්මක කරන ලද වැඩ සටහන්වල ප්‍රගතිය පහත දැක්වේ.

- ලියාපදිංචි තේ නිෂ්පාදකයන්, සකසන්නන් සහ අපනයනකරුවන් සඳහා වෙන්කිරීමේ ක්ෂේත්‍ර හැකියාව (Grading Area Capacity) සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රමය යටතේ තෝරාගත් සමාගම් 02 ක ක්ෂේත්‍ර චාරිකාවේ නිරත වූ අතර එක් ගිවිසුමක් අත්සන් කරන ලදී.
- තේ ක්ෂේත්‍රය සඳහා පද්ධති/නිෂ්පාදන සහතිකකරණය සඳහා සහන ලබාදීමේ යෝජනා ක්‍රමය යටතේ තෝරා ගත් කර්මාන්තශාලා 05කට සහනයන් ලබාදෙන ලදී.
- සන්නම් නාම සහ සන්නම් විශිෂ්ටත්වය සංවර්ධනය කිරීම සඳහා සහන සැලසීමේ යෝජනා ක්‍රමය යටතේ අදාල කාලය තුල සමාගම් 04කට සහන සලසා ඇත. එමෙන්ම Basilur Tea Export Pvt Ltd. සමාගමට සන්නම්නාම ලියාපදිංචිය සඳහා සහන ලබාදෙන ලදී.
- හම්බන්තොට වගා ගෘහ තුල විසිතුරු හා කැපූ මල් වගා කිරීමේ නියුතු 08 දෙනෙකු සඳහා සැපයුම් සංවර්ධන වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලද අතර ඔවුන් ඍජු අපනයන කරුවන්ට සම්බන්ධ කරන ලදී.
- වව්නියාවේ කහ වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහන - පළමු අස්වැන්න ලබාගත් අතර ගොවීන් සහ අපනයනකරුවන් අතර සම්බන්ධතා ගොඩනැංවීම සඳහා කටයුතු කරන ලදී.

- මධ්‍යම පලාත, වයඹ පලාත, දකුණු පලාත සහ හම්බන්තොට යන ප්‍රදේශයන්හි පළතුරු, කුළු බඩු, අගය එකතු කළ තේ සහ කැපූ මල් යනාදී ක්ෂේත්‍රයන්හි නියුතු වගාකරුවන් 200ක් පමණ පිරිසක් සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 06 ක් අදාල කාලය තුල පවත්වන ලදී.
- තෝරාගත් අපනයනකරුවන් සඳහා අපනයන වෙළඳපලට අගය වැඩි එළවළු/කුළු බඩු සැපයීම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ වගා ගෘහ 16 ක වැඩ කටයුතු අවසන් කරන ලදී.
- වයඹ පලාතේ විසිතුරු මල් හා පැල වගාකරුවන් 102 ක් සඳහා අපනයන වෙළඳපල පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ඊශ්‍රායලයේ කෘෂිකාර්මික නිෂ්පාදන සකස් කිරීම් සහ අලෙවිකරණය පිළිබඳ තාක්ෂණික දැනුම ලබා ගැනීමේ වැඩ සටහනකට ශ්‍රී ලංකා ආරක්ෂිත කෘෂි ව්‍යවසායකයින්ගේ සංගමයේ සාමාජිකයින් 07 දෙනෙක් සහභාගී කරවන ලදී.
- කුළු බඩු සහ නිස්සාරක තෙල් නිෂ්පාදන ක්ෂේත්‍රය සඳහා නිෂ්පාදන/පද්ධති සහතිකකරණය සහන සැලසීමේ යෝජනා ක්‍රමය.

**අනෙකුත් වැඩ සටහන්**

**ශ්‍රී ලාංකීය නිෂ්පාදන සහ සේවා විද්‍යුත් මාධ්‍යයෙන් ප්‍රවර්ධනය කිරීම.**

www.srilankabusiness.com යන අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙබ් අඩවිය මගින් ශ්‍රී ලංකාවේ අපනයන නිෂ්පාදන සහ සේවා ප්‍රවර්ධනය කිරීමේ වැඩ සටහනක් අන්තර්ජාලය හරහා ආරම්භ කරන ලදී. එමෙන්ම ශ්‍රී ලංකා කුරුඳු ප්‍රවර්ධනය කිරිම සඳහා ද වෙබ් පිටුවක් සංවර්ධනය කරන ලදී.

**විද්‍යුත් වාණිජ බිහිදොර (විද්‍යුත් වෙළඳ මධ්‍යස්ථාන)**

මෙම අන්තර්ජාල බිහිදොර ඔස්සේ එක්සත් රාජ්‍යය, ස්වීඩනය සහ ජර්මනිය යනාදී රටවල ගැනුම්කරුවන්ගෙන් ශ්‍රී ලාංකීය කුළු බඩු සහ ආයුර්වේද නිෂ්පාදන සඳහා සාර්ථක වෙළඳ ඇණවුම් 05 ක් සිදු කෙරිණ. අදාල කාලය තුල තේ, ඇඟළුම්, සම් ආශ්‍රිත නිෂ්පාදන, සකස් කළ ආහාර, නිල් මැණික්, කැපූ පොල්, මෝටර් බෝට්ටු, එළවළු, මිරිස් සහ අන්නාසි යනාදී නිෂ්පාදන සඳහා වෙළඳ ඇණවුම් 15 ක් පමණ අන්තර්ජාලය ඔස්සේ ලැබී තිබිණ.




**අපනයන ප්‍රගති දර්ශක 2004 – 2013**

පසුගිය දශකයේ අපනයන සංඛ්‍යා දත්තයන් විශ්ලේෂනය කර ‘‘අපනයන ප්‍රගති දර්ශක‘‘ නමින් සවිස්තරාත්මක ප්‍රකාශනයක් සකස් කරන ලද අතර මෙය සංයුක්ත තැටියක් ලෙසද ප්‍රකාශයට පත් කෙරේ.

# <u>2015 වසර සඳහා සැලසුම්</u>

**අපනයන ප්‍රවර්ධන වැඩ සටහන්**

කෘෂිකාර්මික, ධීවර, කාර්මික සහ සේවා ක්ෂේත්‍ර ප්‍රවර්ධනය සඳහා ඒකාබද්ධ සැපයුම් / නිෂ්පාදන / මෝස්තර / තත්ව සහ ඇසුරුම්කරණ සහ වෙළඳපල සංවර්ධන වැඩ සටහන්

- "ජාතික අපනයන උපාය මාර්ගය 2015-2020" සම්පාදනය කිරීම
- අපනයන සංවර්ධන මණ්ඩලයේ උපාය මාර්ගික සැලස්ම 2015-2020 සකස් කිරීම
- අපනයන සංවර්ධන මණ්ඩලය සඳහා ප්‍රගති සංවර්ධන මාර්ග සිතියම ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකා කුරුඳු සන්නම සංවර්ධන හා ප්‍රවර්ධන වැඩ සටහන, තෝරා ගත් අන්තර්ජාතික වෙළඳපලවල වෙළඳ ලකුණ සහ භූගෝලීය දර්ශකය (GI) ලියාපදිංචි කිරීම.
- අගය එකතු කරන ලද කුරුඳු අපනයනයේදී "Pure Ceylon Cinnamon" වෙළඳ ලකුණ භාවිතා කිරීම සඳහා බලපත් නිකුත් කිරීමේ යෝජනා ක්‍රමය
- අපනයන ආදායම වැඩිකිරීම සඳහා සාමූහික සන්නම්කරණය (Corporate Branding) සඳහා සහන සැලසීම.
- තෝරාගත් පලතුරු බෝගයන් සඳහා අපනයන අභිමුඛ කෘෂි කලාප ව්‍යාපෘති පිහිටුවීම (EDB, DOA & F&V Assoc.]
- මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාවේ මිරිදිය මත්ස්‍ය වගාව සංවර්ධනය කිරීම
- විසිතුරු මත්ස්‍ය අපනයන කරුවන් සඳහා නිරෝධායන පහසුකම් සහ රඳවා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා සහන ලබා දීමේ වැඩ සටහන.
- අපනයනකරුවන් අධි තාක්ෂණ ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීම සඳහා සහන ලබා දීම සහ දිරිමත් කිරීම [නවෝත්පාදන සහ නවීකරණය]
- ශ්‍රී ලංකා ජාතික ඇසුරුම් මධ්‍යස්ථානය පිහිටුවීම
- බෝට්ටු කර්මාන්තය සඳහා සංවර්ධන වැඩ සටහන්.
- අගය එකතු කළ නිෂ්පාදනය සඳහා නිෂ්පාදන හා පද්ධති සහතිකරණය සහ සෞඛ්‍ය ආරක්ෂිත නිෂ්පාදන ක්‍රම (GMP) සඳහා සහන සැලසීම
- අපනයනයට සුදුසු කාබනික කෘෂි නිෂ්පාදන සංවර්ධන වැඩසටහන
- පොල් කෙඳි සහ කොකෝපීට් නිෂ්පාදන සංවර්ධන වැඩසටහන
- කාබනික සහතිකකරණය සඳහා ජාතික කාබනික පාලන අධිකාරිය (NOCA) මගින් පිරිවැය අවම කිරීම
- ඇඟළුම් ක්ෂේත්‍රය සඳහා ප්‍රතිරූපය ගොඩ නැගීමේ වැඩ සටහන.
- ශ්‍රී ලංකා ඇඟළුම් ක්ෂේත්‍රයේ හැකියාවන් පෙන්වීම සඳහා ශ්‍රී ලංකා මෝස්තර සැණකෙළිය සංවිධානය කිරිම.
- අන්තර්ජාතික වෙළඳ පලවල ශ්‍රී ලංකා රබර් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රචලිත කිරීම.
- "ශ්‍රී ලංකා බ්ලූ සෆායර්" (නිල් මැණික්) සන්නම ප්‍රවර්ධනය සඳහා ප්‍රචාරාත්මක / ප්‍රතිරූපය ගොඩනැගීමේ වැඩ සටහන

- ලෝක වෙළඳ පල තරඟකාරීත්වය වැඩි කිරීම සඳහා සෙරමික් ක්ෂේත්‍රයේ ඵලදායිතාව වර්ධනය කිරීමේ වැඩ සටහන.
- අපනයනය සඳහා උළු කර්මාන්තය සංවර්ධනය
- අගය එකතු කරන ලද ඛනිජ නිෂ්පාදන අපනයනය කිරීම සඳහා අපනයනකරුවන්ට සහන සැලසීම
- වාත්තු කර්මාන්තය සඳහා තාක්ෂණ සංවර්ධන වැඩසටහන
- සුළු හා මධ්‍ය පරිමාණ අත්යන්ත්‍ර ඇඟළුම් අපනයනකරුවන්ගේ නිෂ්පාදන හා වෙළඳ පල ප්‍රවණතා පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීමේ වැඩ සටහන
- තොරතුරු තාක්ෂණ / ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණයේ නිරත වන අපනයනකරුවන්ගේ උපාය මාර්ගික අවශ්‍යතා සපුරාලීමට ශ්‍රී ලංකාවේ 2013/14 වසර වලදී සම්මන්ත්‍රණයක් පැවැත්වීම.
- තොරතුරු තාක්ෂණ / ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණයේ නිරත වන අපනයනකරුවන්ගේ හැකියාවන් වර්ධනය කිරීම සඳහා අදාල ක්ෂේත්‍රයන් එක් කර සම්මන්ත්‍රණ සංවිධානය කිරීම (ICT කර්මාන්ත, විදුලි සංදේශ සහ විශ්ව විද්‍යාල)
- ලෝක වෙළඳ පලේ පුද්ගල සබඳතා ගොඩ නගා ගැනීමෙන් "ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණය/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණය" සන්නම් කිරීම සහ ප්‍රවර්ධනය.
- අන්තරාල වෙළඳාම, ඉදිකිරීම ක්ෂේත්‍රය, සෞඛ්‍යය සහ ආයුර්වේද යනාදී සේවා ක්ෂේත්‍රයන් සංවර්ධනය
- අන්නාසි වැනි නිෂ්පාදන සඳහා සන්නම්කරණ වැඩසටහන් ආරම්භ කිරීම
- ඉලෙක්ට්‍රොනික ක්ෂේත්‍රයේ අපනයනකරුවන් සඳහා ශ්‍රී ලාංකීය සැපයුම්කරුවන්ගේ තත්ත්ව වර්ධන වැඩ සටහන්.
- කෘෂිකාර්මික, කාර්මික සහ ධීවර අංශයන් හි තත්ව සංවර්ධන වැඩ සටහන්.
- කුළු බඩු ආශ්‍රිත නිෂ්පාදන අංශය සඳහා සංවර්ධන හා ප්‍රවර්ධන වැඩ සටහන්.
- මුද්‍රණ ක්ෂේත්‍රය සඳහා තාක්ෂණ සංවර්ධන වැඩ සටහන්.
- අපනයනයට සූදානම් සුළු හා මධ්‍ය පරිමාණ ත්‍යාග භාණ්ඩ නිෂ්පාදකයන් සංවර්ධන වැඩ සටහන.
- පාවහන් කර්මාන්තය සඳහා තාක්ෂණ සංවර්ධන වැඩ සටහන.
- සියළුම භාණ්ඩ අංශ සඳහා දැනුවත් කිරීමේ වැඩ මුළු, වැඩ සටහන් සහ වෙළඳ පල ප්‍රවර්ධන වැඩ සටහන් සංවිධානය
- උපදේශක සභා රැස්වීම් මගින් රාජ්‍ය හා පෞද්ගලික අංශයන්ගේ සහයෝගීතාවය

**ප්‍රාදේශීය සංවර්ධන වැඩ සටහන**

- කෘෂි අපනයන කලාප ව්‍යාපෘති තවදුරටත් කරගෙන යෑම.
- වයඹ පලාතේ කොහු කර්මාන්තය සඳහා තිරසාර ශක්ති කළමණාකරන වැඩ සටහන
- කැපූ මල් හා විසිතුරු පැල සංවර්ධන ව්‍යාපෘති
- නැගෙනහිර පලාතේ අපනයනය සඳහා කාබනිකව මිරිස් සහ කහ වගා කිරීම සංවිධානය
- මධ්‍යම පලාතේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදකයින් එක් කිරීමේ වැඩ සටහන
- සැපයුම් සංවර්ධනයට වයඹ පලාතේ අපනයනය සඳහා වටිනාකමින් වැඩි එළවළු සහ කුළු බඩු ව්‍යාපෘතිය

- දකුණු පලාතේ කුරුඳු සැකසුම් කර්මාන්ත ශාලා සහ නිස්සාරක තෙල් නිෂ්පාදන ස්ථාන සඳහා තත්ත්ව සහතික ලබා ගැනීමට සහායවීම.
- මඩකලපුව දිස්ත්‍රික්කයේ අපනයනය සඳහා අන්නාසි වගා කිරීමේ නියමු ව්‍යාපෘතිය සහ අම්පාර දිස්ත්‍රික්කයේ අන්නාසි පැල තවාන් සැකසීම සංවිධානය
- ලියාපදිංචි තේ නිෂ්පාදකයන්, සකසන්නන් සහ අපනයනකරුවන් සඳහා වෙන්කිරීමේ ක්ෂේත්‍ර හැකියාව (Grading Area Capacity) සංවර්ධනය කිරීමේ යෝජනා ක්‍රම
- තේ නිෂ්පාදනය සඳහා පද්ධති/ නිෂ්පාදන සහතිකරණය සඳහා සහන සැලසීම
- සන්නම් නාමයන් හා සන්නම් විශිෂ්ඨත්වය සංවර්ධනය සඳහා සහන සැලසීම

**වෙළඳ පල සංවර්ධන වැඩ සටහන්**

- තෝරා ගත් ප්‍රමුඛ සහ නැඟී එන වෙළඳපලවල අන්තර්ජාතික වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා සහභාගීත්වය සංවිධානය කිරීම.
- වෙළෙඳපල විවිධාංගීකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම (රුසියාවට මත්ස්‍ය නිෂ්පාදන, ජපානයට ඇඟළුම්, ජපානයට, මැදපෙරදිග හා අප්‍රිකාවට මෘදුකාංග, ඉන්දියාවට රබර් ස්වයංක්‍රීය නිෂ්පාදන, කොරියාවට රබර් නිෂ්පාදන, මියන්මාරයට ඉදිකිරීම් සේවා, මාලදිවයිනට අධ්‍යාපන සේවා, යුරෝපයට සෞඛ්‍ය සේවා)
- තෝරා ගත් වෙළඳ පලවල අභ්‍යන්තර සහ බාහිර වෙළඳ ධූත නියෝජනයන් සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකා අපනයන ක්ෂේත්‍රයේ ප්‍රතිරූපය ගොඩ නැඟීම සඳහා සුදුසු වෙළඳ පල සන්නිවේදන උපායයක් ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකා නිෂ්පාදන සහ සේවා අනෙකුත් රටවල ප්‍රවර්ධනය සඳහා ධූත මෙහෙවරේ යෙදෙන වාණිජ දෙපාර්තමේන්තු නිලධාරීන් හා සමීපව කටයුතු කිරීම.
- වෙළඳපල පර්යේෂණ / සමීක්ෂණ සිදු කිරීම.
- දේශීය වෙළඳ ප්‍රදර්ශනවල ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ සහභාගීත්වය සංවිධානය කිරීම. උදා. Facets, Luster, Ayurveda, Profoods
- දේශීය වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම.
- ශ්‍රී ලංකාවේ දී අන්තර්ජාතික සම්මේලනයන් පැවැත්වීම - IEFEAT, ATPF, ICA Congress
- පාවහන් හා සම්භාණ්ඩ ප්‍රදර්ශනය 2015 සංවිධානය කිරීම.

**වෙනත් වැඩ සටහන්**

- අපනයන ඇසුරුම්කරණය සංවර්ධනය
- වෙළඳ තොරතුරු හා වෙළඳ පල තොරතුරු බෙදා හැරීම විද්‍යුත් වාණිජ්‍ය සේවා සහ අපනයන ආශ්‍රිත ප්‍රකාශන
- අපනයනකරුවන්ගේ ගැටළු නිරාකරණය (අපනයනකරුවන්ගේ සංසදය)
- ආනයන අපනයන ක්‍රියාවලිය හා අපනයන ඇසුරුම්කරණය පිළිබඳ පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපනයන ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන්, කුසලතා සංවර්ධන වැඩ සටහන් සහ ව්‍යවසායකයන් සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2014.12.31. දිනට මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | එස්.එල්. එෆ්.ආර්.එස් 31.12.2014 රු. ශත. | එස්.එල්. එෆ්.ආර්.එස් 31.12.2013 රු. ශත. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ශුද්ධ දේපල පිරියත හා උපකරණ | (9) | 64,144,109.91 | 69,164,698.78 |
| සඳහන් නොකෙරුණු සමාගම් ආයෝජන | (10) | 888,590,808.00 | 805,459,768.00 |
| වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම් | (11) | 40,548,150.00 | 40,548,150.00 |
| | | 993,283,067.91 | 915,172,616.78 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | (12) | 1,318,144.08 | 1,330,321.91 |
| විකිණීමට ඇති ජංගම නොවන වත්කම් | | - | - |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | (13) | 148,466,803.11 | 150,237,754.18 |
| අත්තිකාරම් හා ඉදිරි ගෙවීම් | (14) | 51,334,602.58 | 40,694,347.10 |
| මුදල් හා මුදල් සමාන දෑ | (15) | 37,597,978.87 | 16,852,165.84 |
| | | 238,717,528.64 | 209,114,589.03 |
| **මුළු වත්කම්** | | **1,232,000,596.55** | **1,124,287,205.81** |
| **හිමිකම් හා වගකීම්** | | | |
| **ප්‍රාග්ධන සහ වෙන් කිරීම්** | | | |
| ආධාර ලැබීම් | (16) | 19,362,941.48 | 20,706,020.21 |
| වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | 1,026,271,483.80 | 920,619,619.11 |
| **මුළු හිමිකම්** | | 1,045,634,425.28 | 941,325,639.32 |
| **ජංගම නොවන වගකීම්** | | | |
| වෙන්කිරීම් හා අනිකුත් වගකීම් | (17) | 26,525,183.86 | 22,089,408.88 |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | (18) | 84,374,275.25 | 79,955,076.27 |
| | | 110,899,459.11 | 102,044,485.15 |
| අනිකුත් ගෙවීම් | (19) | 63,230,456.75 | 63,768,000.39 |
| බැංකු අයිරාව | (20) | 12,236,255.41 | 17,149,080.95 |
| | | 75,466,712.16 | 80,917,081.34 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,232,000,596.55** | **1,124,287,205.81** |

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරණු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2014.12. 31 දිනට අත්සන් කලේ,

| | | |
|---|---|---|
| ……………………………… | ………………………………….. | …………………………………………. |
| **ඉන්දිරා මල්වත්ත** | **ආචාර්ය වයි.කේ.මරික්කාර්** | **පී.කේ.සුමිත්‍රාරච්චි** |
| **සභාපතිනිය සහ ප්‍රධාන විධායක** | **විධායක අධ්‍යක්ෂ** | **අධ්‍යක්ෂිකා** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2014.12.31. දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ප්‍රකාශය

| | සටහන | එස්.එල්. එෆ්. ආර්.එස් 31.12.2014 රු. ශත. | එස්.එල්. එෆ්. ආර්. එස් 31.12.2013 රු. ශත. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| ආදායම | (3) | 607,956,169.40 | 558,606,933.51 |
| අනෙකුත් ආදායම් | (4) | 132,410,214.45 | 98,471,989.91 |
| මුළු ආදායම | | 740,366,383.85 | 657,078,923.42 |
| **වියදම්** | | | |
| අපනයන සංවර්ධන වියදම | (5) | (300,282,286.93) | (234,406,882.33) |
| පරිපාලන වියදම | (6) | (332,116,077.42) | (320,671,883.37) |
| මෙහෙයුම් වියදම් ඉක්මවූ ආදායම | | 107,968,019.50 | 102,000,157.72 |
| මූල්‍ය වියදම් | (7) | (2,216,154.81) | (1,485,313.55) |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වියදම ඉක්මවූ අතිරික්තය | | 105,751,864.69 | 100,514,844.17 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | | |
| දේපළ හා පිරියත උපලබ්ධියෙන් ලාභ/(අලාභ) | (8) | (100,000.00) | - |
| ආයු ගණක ලාභ/නිර්වප්ජිත ප්‍රතිලාභ සැලසුම්මත | | - | - |
| විදේශ කටයුතු මත මූල්‍ය ප්‍රකාශන පරිවර්තන සඳහා- -ලාභය/පාඩුව. | | - | - |
| මූල්‍ය වත්කම් විකිනීමෙන් ලාභ(පාඩු) | | - | - |
| වර්ෂයේ අනිකුත් මුළු ආදායම | | (100,000.00) | - |
| **වර්ෂයේ මුළු ආදායම** | | **105,651,864.69** | **100,514,844.17** |

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**<u>2014.12.31 දිනට අවසන් වර්ෂය සඳහා -මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>**

| | **2014 (රු)** |
|---|---:|
| **මෙහෙයුම් වලින් ලද මුදල් ප්‍රවාහය** | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් ලද වියදමට වැඩි ආදායම | 105,651,865 |
| | |
| **<u>ගැලපීම්</u>** | |
| ක්ෂයවීම් | 10,283,639 |
| ආයෝජන වලින් ලද ආදායම | (123,308,069) |
| දේපල පිරියත උපකරණ විකිණීමෙන් ලද ලාභය | (1,967,736) |
| ප්‍රත්‍යාගණන අලාභ | 100,000 |
| මූල්‍ය වියදම | 359,624 |
| රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය | (1,343,079) |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | 13,496,607 |
| ආයෝජන සඳහා වෙන්කිරීම් වෙනස්වීම් | - |
| **කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය** | **3,272,851** |
| | |
| තොගය (වැඩිවීම/අඩුවීම) | 12,178 |
| ණය ගැති හා ලැබියයුතු දෑ (වැඩිවීම/අඩුවීම) | 1,770,951 |
| අත්තිකාරම් හා කලින් ගෙවීම්(වැඩිවීම/අඩුවීම) | (10,640,255) |
| වෙන්කිරීම් හා වෙනත් ගෙවියයුතු දෑ(වැඩිවීම/අඩුවීම) | 4,435,775 |
| වෙනත් ගෙවියයුතු දෑ (වැඩිවීම අඩුවීම) | (537,544) |
| **මෙහෙයුම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | **(1,686,045)** |
| | |
| මූල්‍ය වියදම් ගෙවීම් | (359,624) |
| පාරිතෝෂික ගෙවීම් | (9,077,408) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ගලායාම** | **(11,123,076)** |
| | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය** | |
| ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම් | (6,808,384) |
| ස්ථාවර වත්කම් විකිනීමෙන් ලද මුදල් | 3,413,069 |
| සමාගම් කොටස් වලින් ලද ආදායම | 83,131,040 |
| ලාභාංශ ලැබීම් | 37,965,315 |
| පොලී ලැබීම් | 2,211,715 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලාඒම** | **119,912,754** |
| | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් ජනනය වූ මුදල් ප්‍රවාහය** | |
| කොටස් ආයෝජන | (83,131,040) |
| ආයෝජන නිදහස් කිරීම් | - |
| **මූල්‍ය ක්‍රියායාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(83,131,040)** |
| | |
| වර්ෂය තුල මුදල් හා මුදල් සමාන දෑ වැඩිවීම/අඩුවීම | 25,658,639 |
| වර්ෂය ආරම්භයෙ' මුදල් හා මුදල් සමාන දෑ | (296,915) |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ** | **25,361,724** |
| | |
| **<u>මුදල් හා මුදල් සමානම දෑ විශ්ලේෂණය</u>** | |
| බැංකුවේ අතෙ' මුදල් | 37,597,979 |
| අතැති මුදල් | (12,236,255) |
| | **25,361,724** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**2014.12.31. දිනට අවසන් වර්ෂය සඳහා**

**හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය**

| | | රාජ්‍ය ආධාර | සමුච්චිත ලාභ | එකතුව |
|---|---|---|---|---|
| 2013.01.01 දිනට ශේෂය | | 22,049,098.94 | 401,627,915.94 | 423,677,014.88 |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | - | 100,514,844.17 | 100,514,844.17 |
| රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය | | (1,343,078.73) | - | (1,343,078.73) |
| පෙර වර්ෂයේ ගැලපීම් | **(21)** | - | 418,476,859.00 | 418,476,859.00 |
| 2013.12.31. ශේෂය | | 20,706,020.21 | 920,619,619.11 | 941,325,639.32 |
| සාමාන්‍ය ක්‍රියා වලින් වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය | | - | 105,651,864.69 | 105,651,864.69 |
| රාජ්‍ය ලැබීම් සඳහා ක්‍රමක්ෂය | | (1,343,078.73) | - | (1,343,078.73) |
| 2014.12.31. දිනට ශේෂය | | **19,362,941.48** | **1,026,271,483.80** | **1,045,634,425.28** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**2014.12.31. දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්**

| | | එස්.එල්. එෆ්.ආර්.එස් 31.12.2014 රු. ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2013 රු. ශත. |
|---|---|---|---|
| **(3)** | **ආදායම** | | |
| | රාජ්‍ය ලැබීම් | 518,000,000.00 | 483,950,000.00 |
| | ආනයන සේවා ආදායම් | 68,596,668.00 | 43,609,547.97 |
| | CHOGM 2013 | 9,120,000.00 | 19,692,435.47 |
| | පලාත් කාර්යාල ආදායම් | 27,134.75 | 38,514.62 |
| | අන්තර්ජාල ආදායම් | 367,859.00 | 303,609.00 |
| | විද්‍යුත් වෙළඳ ආදායම | 316,195.56 | 110,195.32 |
| | එක්ස්පෝ 2012 ආදායම | 1,000,000.00 | 1,504,176.28 |
| | සම්මන්ත්‍රණ හා පාඨමාලා ගාස්තු | 2,770,242.00 | 1,875,350.00 |
| | වෙළඳ කුටි ආදායම-සම් භාණ්ඩ ප්‍රදර්ශණය 2014 | 6,543,145.09 | 7,221,848.45 |
| | පොත් අලෙවිය | 309,425.00 | 232,856.00 |
| | අනෙකුත් ආදායම් | 905,500.00 | 68,400.00 |
| | | **607,956,169.40** | **558,606,933.51** |
| **(4)** | **අනෙකුත් ආදායම්** | | |
| | පොලී ආදායම් | 2,211,714.68 | 1,970,363.53 |
| | ආශ්‍රිත සමාගම් ලාභ | 83,131,040.00 | 47,862,116.00 |
| | ලාභාංශ | 37,965,314.57 | 36,415,076.22 |
| | ආයෝජන ඇවර කිරීමේ පාඩු | 1,967,735.68 | - |
| | අනිකුත් විවිධ ආදායම් | 1,045,364.07 | 4,533,445.38 |
| | ක්‍රමක්ෂය රාජ්‍ය ආධාර | 1,343,078.73 | 1,343,078.73 |
| | සේවක ණය පොලී | 4,745,966.72 | 6,007,785.90 |
| | විනිමය අනුපාත වෙනස | - | 340,124.15 |
| | | **132,410,214.45** | **98,471,989.91** |
| **(5)** | **අපනයන සංවරAධන වියදම්** | | |
| | අපනයන සංවර්ධන වැඩසටහන් | 80,298,367.71 | 78,062,093.57 |
| | EU ශ්‍රී ලංකා කාබනික නිශ්පාදන | 570,611.09 | 1,503,150.41 |
| | අපනයන වෙළඳ ප්‍රවර්ධන | 92,264,081.98 | 59,412,217.82 |
| | CHOGM 2013 | 82,405,173.94 | 34,270,326.12 |
| | වෙළඳ නියෝජිත සහභාගිතAවය | 531,303.11 | 971,371.20 |
| | දෙAශීය වෙළඳ ප්‍රදර්ශන | 2,181,155.30 | 341,208.60 |
| | ප්‍රතිපත්ති හා සැලසුම් | 977,162.38 | 2,174,154.74 |
| | අපනයන වෙළඳ ප්‍රවර්ධන | 9,424,470.21 | 28,192,265.75 |
| | සේවක වියදම් | - | 1,591,713.77 |
| | ප්‍රාදේශීය සංවර්ධන වියදම් | 19,026,572.10 | 22,153,559.34 |
| | වෙළඳ තොරතුරු හා සේවා වියදම් | 7,639,200.33 | 4,547,663.00 |
| | අන්තර්ජාල වියදම් | 3,404,465.89 | 949,206.61 |

| | | |
|---|---|---|
| ඒකාබද්ධ කෘෂි ආදාර්ශ ව්‍යාපෘති | 2,680.00 | 10,019.00 |
| කාර්මික නිශ්පාදන සඳහා තත්ව සහතික | - | 227,932.40 |
| ශ්‍රී ලංකා කුරුඳු සන්නම් නිර්මාණය | 1,557,042.89 | - |
| | **300,282,286.93** | **234,406,882.33** |

**(6) පරිපාලන වියදම්**

| | | |
|---|---|---|
| වැටුප් හා වේතන | 109,968,561.74 | 107,091,001.93 |
| අතිකාල හා නිවාඩු දීමනා | 8,328,658.36 | 8,653,737.90 |
| ප්‍රසාද දීමනා | 2,687,512.50 | 2,010,474.16 |
| සේවක අර්ථ සාධක අරමුදල | 12,958,600.38 | 12,941,816.19 |
| සේවක භාරකාර අරමුදල | 2,545,187.66 | 2,659,201.49 |
| විශ්‍රාම වැටුප් | 34,000.00 | - |
| පාරිතෝෂික දීමනා | 13,496,606.73 | 9,703,139.95 |
| සුභසාධන | 20,355,505.15 | 33,523,646.31 |
| බඳවාගැනීම් වියදම් | 262,569.43 | 41,050.80 |
| සේවක පිරිවැය | 4,745,966.72 | 6,007,785.90 |
| විÿලි ගාස්තු | 22,471,618.02 | 21,332,198.95 |
| ජල ගාස්තු | 789,544.24 | 664,796.13 |
| නීති හා වෙනත් වෘත්තීය ගාස්තු | 66,874.40 | 710,512.00 |
| ප්‍රචාරණය | 489,776.00 | 646,640.00 |
| ආරක්ෂක වියදම් | 4,236,270.54 | 3,729,341.14 |
| විගණන ගාස්තු | 1,039,239.00 | 600,000.00 |
| මුද්‍රණ වියදම් | 956,654.80 | 2,416,842.72 |
| ගමන් වියදම් | 15,705,709.54 | 1,086,696.00 |
| විනෝදාශAවාද | 254,383.60 | 351,401.20 |
| පොÿ වියදම් | 1,682,354.10 | 1,086,174.39 |
| අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | 571,270.00 | 467,376.00 |
| කාර්යාල උපකරණ නඩත්තුව | 971,931.65 | 1,270,581.01 |
| ගෙවල් කුලී | 63,500,001.60 | 59,938,710.41 |
| ඉන්ධන හා තෙල් | 8,397,404.96 | 9,100,544.98 |
| වාහන නඩත්තු අලුත් වැඩියා | 6,653,826.76 | 5,093,439.67 |
| පුද්ගලික කුලී | 5,739,629.40 | 5,596,328.92 |
| සන්නිවේදන හා සාමාජික මුදල් | 8,216,618.66 | 7,906,128.08 |
| ක්ෂය අඳහා වෙන් කිරීම් | 10,283,639.34 | 10,059,460.91 |
| දේශීය පුහුණු වියදම් | 338,961.40 | 653,335.18 |
| කාර්යාල අවශ්‍යතා | 3,912,601.53 | 3,557,672.67 |
| ස්ථාවර වත්කම් විකිණීමෙන් අලාභය | - | 1,199,008.83 |
| විදේශීය පුහුණු වියදම් | 408,458.96 | 572,839.55 |
| විනිමය අනුපාත අලාභ | 46,140.25 | - |
| | **332,116,077.42** | **320,671,883.37** |

**(7)** **මූල්‍ය පිරිවැය**

| | | |
|---|---:|---:|
| පොලී වියදම් | 359,623.59 | 354,736.88 |
| මුද්දර ගාසAතු | 971,611.00 | 71,905.40 |
| මූල්‍ය වියදම් | 884,920.22 | 1,058,671.27 |
| | **2,216,154.81** | **1,485,313.55** |

**(8)** **මෝටර් රථ ප්‍රත්‍යාගණය**

මණ්ඩලයට අයිති මෝටර් රථ ශ්‍රී ලංකා ඔටෝමොබයිල් සමාගම විසින් 2012.12.31 දිනට නැවත අගය කරන ලදි . වසර පහකට වරක් මෝටර් රථ වාහන නැවත අගය කිරීමට බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

2014 .12.31.දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්

## (9) දේපල යන්ත්‍ර හා උපකරණ

### (9.1) පිරිවැය

| වත්කම් | ශේෂය 1/1/2014 | එකතුකිරීම් | නැවත තක්සේරු කිරීම | ඉවත් කිරීම් | ශේෂය 31/12/2014 |
|---|---|---|---|---|---|
| ගෘහස්ත ÿරකථන | 99,364.00 | - | - | - | 99,364.00 |
| මෝටර් රථ | 51,600,000.00 | 1,950,000.00 | (100,000.00) | 3,900,000.00 | 49,550,000.00 |
| පරිගණක | 28,992,255.02 | 2,948,958.00 | - | - | 31,941,213.02 |
| පරිගණක මෘÿකාංග | 2,232,651.50 | 1,933,299.50 | - | 20,670.00 | 4,145,281.00 |
| පරිගණක උපකරණ | 463,206.31 | 517,261.01 | - | - | 980,467.32 |
| රූපවාහිනී උපකරණ | 4,730,855.01 | - | - | - | 4,730,855.01 |
| පී.ඒ.බී.එක්ස් උපකරණ | 65,549.00 | - | - | - | 65,549.00 |
| ÿරකථන සවිකිරීම් | 1,481,640.14 | 13,750.00 | - | - | 1,495,390.14 |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 28,827,844.25 | 1,415,785.28 | - | - | 30,243,629.53 |
| | **118,493,365.23** | **8,779,053.79** | **(100,000.00)** | **3,920,670.00** | **123,251,749.02** |

### (9.2) ක්ෂය වෙන්කිරීම්

| | ශේෂය 1/1/2014 | වර්ෂය සඳහා ක්ෂය | ඉවත් කිරීම් සඳහා ක්ෂය වෙන් කිරීම් | ශේෂය 31/12/2014 |
|---|---|---|---|---|
| ගෘහස්ත ÿරකතන | 61,245.78 | 7,121.64 | - | 68,367.42 |
| මෝටර් රථ | 6,065,000.00 | 5,789,666.67 | (504,666.68) | 11,349,999.99 |
| පරිගණක | 21,937,155.34 | 2,408,943.24 | - | 24,346,098.58 |
| පරිගණක මෘÿකාංග | 1,740,157.85 | 238,126.92 | - | 1,978,284.77 |
| පරිගණක උපකරණ | 235,966.09 | 105,933.18 | - | 341,899.27 |
| රූපවාහිනී උපකරණ | 3,080,823.45 | 222,112.11 | - | 3,302,935.56 |
| පී.ඒ.බී.එක්ස් උපකරණ | 26,842.97 | 3,870.60 | - | 30,713.57 |
| ÿරකතන සවිකිරීම් | 1,263,509.25 | 77,614.76 | - | 1,341,124.01 |
| ලී බඩු හා කාර්යාල උපකරණ | 14,917,965.72 | 1,430,250.22 | - | 16,348,215.94 |
| | **49,328,666.45** | **10,283,639.34** | **(504,666.68)** | **59,107,639.11** |

| ලියා හරින ලද වටිනාකම | 2014 | 2013 |
|---|---|---|
| පිරිවැය | 123,251,749.02 | 118,493,365.23 |
| සමුච්චිත ක්ෂය කිරීම් | (59,107,639.11) | (49,328,666.45) |
| ලියා හරින ලද වටිනාකම | **64,144,109.91** | **69,164,698.78** |

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**2014**.12.31 අවසන් වර්ෂය සඳහා

<u>මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සටහන්</u>

| | | එස්.එල්.එෆ් ආර්.එස් 31.12.2014 රු ශත. | එස්.එල්.එෆ්.ආර්.එස් 31.12.2013 රු ශත. |
|---|---|---|---|
| **(10)** | **ආශ්‍රිත සමාගම් ආයෝජන - ලයිස්තුගත නොවන** | | |
| | ආශ්‍රිත සමාගම් ආයෝජන - ඩී.එච්.පී.එල්. | 888,590,808.00 | 805,459,768.00 |
| | | **888,590,808.00** | **805,459,768.00** |
| **(11)** | **වෙනත් ජංගම නොවන මූල්‍ය වත්කම්** | | |
| | නිදහස් කළ හැකි වරණීය කොටස් | 105,058,083.78 | 105,058,083.78 |
| | සාමාන්‍ය කොටස් | 58,312,483.62 | 58,312,483.62 |
| | (-)හානිකරන සඳහා වෙන් කිරීම් | (122,822,417.40) | (122,822,417.40) |
| | | **40,548,150.00** | **40,548,150.00** |
| **(12)** | **තොගය** | | |
| | ලිපිද්‍රව්‍ය | 1,318,144.08 | 1,319,721.91 |
| | ටයර් හා ටියුබ් | – | 10,600.00 |
| | | **1,318,144.08** | **1,330,321.91** |
| **(13)** | **වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ** | | |
| | අපනයන කරුවන්ගේ ණය | 46,391,543.87 | 46,413,543.87 |
| | (-)ණය ගැති හානිකරන වෙන් කිරීම් | (45,477,591.40) | (45,477,591.40) |
| | කාර්ය මණ්ඩල ණය | 43,867,269.13 | 47,487,670.34 |
| | (-)ගෙවිය යුතු සේවක පිරිවැය | (14,704,943.13) | (16,060,711.67) |
| | ලැබිය යුතු වැට් | 104,676,878.80 | 104,676,878.80 |
| | වෙනත් තැන්පතු | 13,713,645.84 | 13,197,964.24 |
| | | **148,466,803.11** | **150,237,754.18** |
| **(14)** | **අත්තිකාරම් හා ගෙවීම්** | | |
| | ගෙවීම් | 18,360,928.24 | 15,195,600.35 |
| | අත්තිකාරම් | 15,981,790.75 | 7,151,094.62 |
| | බැංකු සුරක්ෂිත | 300,000.00 | 300,000.00 |
| | සේවා තැන්පතු | 1,002,550.30 | 1,002,550.30 |
| | ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතු | 969,390.16 | 969,390.16 |
| | අවලංගු චෙක්පත් | 15,000.00 | 15,000.00 |
| | කලින් ගෙවූ කාර්ය මණ්'ඩල වියදම් | 14,704,943.13 | 16,060,711.67 |
| | | **51,334,602.58** | **40,694,347.10** |

**(15) මුදල් හා මුදල් සමාන දෑ**

| | | |
|---|---|---|
| ලංකා බැංකුව - මුදල් අයකැමි තැන්පත් | 2,500.00 | - |
| ලංකා බැංකුව - ලේක් වීව් | 26,733,368.90 | 15,067,165.78 |
| ජාතික සංවර්ධන බැංකුව | 6,067,851.26 | 62,406.51 |
| ලංකා බැංකුව - කෝපරේට් ශාඛාව | 4,683,705.38 | 1,638,984.99 |
| සම්පත් බැංකුව - නුවර | 4,471.75 | 4,259.89 |
| සම්පත් බැංකුව - ගාල්ල | 6,625.89 | 6,315.18 |
| ලංකා බැංකුව - අම්පාර | 3,392.04 | 2,712.19 |
| ලංකා බැංකුව - හම්බන්තොට | 1,780.64 | 1,756.50 |
| ලංකා බැංකුව - බදුල්ල | 3,789.14 | 3,066.15 |
| ලංකා බැංකුව - මනAනාරම | 413.71 | - |
| සම්පත් බැංකුව- කුරුණෑගල | 1,373.76 | 1,129.64 |
| අතැති මුදල් | 88,706.40 | 64,369.01 |
| | **37,597,978.87** | **16,852,165.84** |

**(16) රජයේ ලැබීම්**

| | | |
|---|---|---|
| රජයේ දායකය | 7,904,002.00 | 7,904,002.00 |
| රජයේ දායකය මෝටර් රථ | 13,000,000.00 | 13,000,000.00 |
| යූ.එන්.ජී.ඩී දායකය | 2,110,282.00 | 2,110,282.00 |
| අයි.ටී.සී දායකය | 12,716.35 | 12,716.35 |
| අපනයන ප්‍රවර්ධන ලේකම් කාර්යාලය | 202,677.32 | 202,677.32 |
| (-)රජයේ ආධාර ක්‍රමක්ෂය | (3,866,736.19) | (2,523,657.46) |
| | **19,362,941.48** | **20,706,020.21** |

**(17) වෙනත් වගකීම් හා වෙන්කිරීම්**

| | | |
|---|---|---|
| ණය ආධාර ක්‍රම දායකත්වය | 7,567,706.09 | 7,359,415.95 |
| ඌව පරණගම ආශ්‍රිත ගම්මාන | 2,108,251.77 | 2,108,251.77 |
| අපනයනකරු දායකත්වය | 19,055,549.00 | 15,959,129.16 |
| ඌව පරණගම පාලන ගිණුම | (10,403,683.00) | (10,403,683.00) |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 8,197,360.00 | 7,066,295.00 |
| | **26,525,183.86** | **22,089,408.88** |

**(18) පාරිතෝෂික සඳහා වෙන් කිරීම්**

| | | |
|---|---|---|
| ඉදිරියට ගෙන ආ ශේෂය | 79,955,076.27 | 79,631,378.23 |
| වර්ෂය තුල කළ වෙන් කිරීම් | 13,496,606.73 | 9,703,139.95 |
| වර්ෂය තුල කළ ගෙවීම් | (9,077,407.75) | (9,379,441.91) |
| ඉදිරියට ගෙන ආ ශේෂය | **84,374,275.25** | **79,955,076.27** |

**(19) වෙළඳ ගෙවියයුතු දෑ**

| | | |
|---|---|---|
| ගෙවිය යුතු මුද්දර ගාස්තු | 15,775.00 | 15,475.00 |
| ගෙවිය යුතු වැටුප් | 19,922.30 | 21,872.30 |
| ගෙවිය යුතු විවිධ වියදම් | - | - |
| ගෙවිය යුතු සේ. අ. අ. වියදම් | 1,882,605.64 | 1,662,418.28 |
| ගෙවිය යුතු සේ.භා. අ. වියදම් | 225,912.82 | 199,490.30 |
| විශ්‍රාම වැටුප්ගෙවීම් | 397.50 | - |

| | | |
|---|---|---|
| සේවක අවසාන ගෙවීම් | 61,644.46 | 61,714.46 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | 3,269,004.00 | 2,487,075.00 |
| නැවත ගෙවිය යුතු ආරකAෂක තැන්පතු | 2,500.00 | 2,500.00 |
| ගෙවිය යුතු රකAෂණ | 12,357.14 | - |
| නැවත ගෙවිය යුතු තැන්පතු- ටෙනAඩ'ර | 76,000.00 | 52,000.00 |
| ඉදිරිපත් නොකල චෙක්පත් | 317,233.95 | 1,051,078.05 |
| වෙනත් උපචිත වියදම් | 57,347,103.94 | 57,122,377.00 |
| කෘෂි කලාප ගෙවීම් සඳහා වෙන් කිරීම් | - | 1,092,000.00 |
| | **63,230,456.75** | **63,768,000.39** |

**(20) බැංකු අයිරාව**

| | | |
|---|---|---|
| ලංකා බැකුව - ලේක් වීව් | 12,235,606.53 | 17,148,432.07 |
| ලංකා බැංකුව - ගාල්ල | 648.88 | 648.88 |
| ජාතික සංවර්ධන බැංකුව | - | - |
| අවලංගු කළ චෙක්පත් | - | - |
| | **12,236,255.41** | **17,149,080.95** |

**(21) පෙර වර්ෂයේ ගැලපුම්**

අපනයන සංවර්ධන මණ්ඩලයේ කොටස් අයිතිය ඇති ඩී.එච්.පී.එල් සමාගමේ ගැලපුම් සැකසීම මෙහි පිලිබිඹු වේ.

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**
**<u>2014 .12.31.දිනට මූල්‍ය ප්‍රකාශනවල සටහන්</u>**

**(1)** ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත 39 ට අනුව හිමිකම් කොටස් ආයෝජනය හානිකරණ පරීක්ෂා කරන ලදි. ඒ අනුව 01.01.2011 දිනට හානිකරන වෙන් කිරීම නැවත ගැලපීම රු **31,698,150** කි.

**(2)** **(2.1)** ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත 39 ට අනුව භාණ්ඩාගාරයෙන් ලද ප්‍රධාන රෙගු රැස්කිරීම හානිකරණ පරීක්ෂා කරන ලදි. ඒ අනුව 01.01.2011 දිනට හානිකරන වෙන් කිරීම් රු: 468,742,488.83 හඳුනාගන්නා ලදි.

**(2.2) කාර්ය මණ්ඩල ණය**

ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 39 ට අනුව 01.01.2011 දිනට පැවති කාර්ය මණ්ඩල ණය පවත්නා පොලී අනුපාතයට අනුව හානිකරණ පාඩු අඩුකොට අවකරණය කරන ලදි . ඒ අනුව ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය සහ එස්.එල්.එෆ් ආ'ර්.එස් ගැලපීම් අගය රු: 16,060,711.67 ගිණුම්කරණ පොත්වල ගලපන ලදි.

**(2.2.1)** එස්.එල්.එෆ් ආ'ර්.එස්.ගැලපීම් ගිණුමේ ශේෂය කාර්ය මණ්ඩල ණය ගිණුමෙන් අඩුකරන ලදි. ඒ අනුව කාර්ය මණ්ඩල ණය මූල්‍ය තත්ව ප්‍රකාශනයේ සාධාරණ අගයට පෙන්වා ඇත.

| | |
|---|---|
| කාර්ය මණ්ඩල ණය | 43,867,269.13 |
| එස්,එල්.එෆ් ආර්.එස් ගැලපීම් | (14,704,943.13) |
| | 29,162,326.00 |

**(2.2.2)** **ඉහත ගැලපීමෙන් හටගත් ඉදිරියට කළ කාර්ය මණ්'ඩල පිරිවැය ජංගම වත්කම් යටතේ පෙන්වා ඇත.**

ඉදිරියට කළ කාර්ය මණ්ඩල පිරිවැය <u>14,704,943.13</u>

**(3)** ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිත අංක 39 ට අනුව එක්ස්පෝ ඒකකයට ගෙවිය යුතු ශේෂය අවකරණය කරන ලදි. මෙය ඉහත ගැලපීමෙන් හටගත් බලපෑම පෙන්වයි.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } ඊසී2/එෆ්/ඊඩීබී/1/14/40    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 ඔක්තෝබර් 07 දින

සභාපති,

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපතිවරයා වෙත 2015 මැයි 28 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01

(i) සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා රජයේ ප්‍රදාන පිළිවෙලින් රු.8,779,054 ක් හා රු.1,756,112 ක් ලැබී තිබුණ අතර එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධන ප්‍රදාන වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ii) ප්‍රමිතිය අනුව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරන සියළුම වටිනාකම් සඳහා පසුගිය කාලපරිච්ඡේදයට අදාළ සංසන්දනාත්මක තොරතුරු දැක්විය යුතු වුවත් දේපල, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07

(i) ප්‍රමිතිය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් පැහැදිලිව හඳුනා ගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනය නිවැරදි සකස් කර නොතිබුණ අතර අත ඉතිරි මුදල් හා බැංකු ශේෂය නිවැරදිව විග්‍රහ කර නොතිබුණි.

(ii) ආශ්‍රිත සමාගමේ රු. 83,131,040 ක් වූ ලාභ කොටස ගැළපීම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මුදල් ප්‍රවාහ වශයෙන් ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත මුදල් ප්‍රවාහ යටතේ දක්වා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08

(i) 2011 දෙසැම්බර් 31 දක්වා ස්ථාවර වත්කම් ක්ෂය ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස පැවති හීනවන ශේෂ ක්‍රමය 2012 වර්ෂයේ සිට සරල මාර්ග ක්‍රමයට වෙනස් කර තිබුණද ප්‍රමිතිය අනුව ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කිරීමේදී අතීතානුයෝගීව නිවැරදි කර නොතිබුණි.

(ii) ප්‍රමිතිය අනුව රු.418,476,859 ක් වූ පෙර වර්ෂ ගැළපීම් මූල්‍ය ප්‍රකාශනවල අතීතානුයෝගීව ගැළපීමට හා විස්තරාත්මකව හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) පෙර වර්ෂයේදී ප්‍රත්‍යාගණන ලාභය රු.100,000 වැඩියෙන් දැක්වීම ප්‍රමිතිය අනුව ගැළපීම් නොකර, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ විස්තීර්ණ නොවන ආදායම් යටතේ ගළපා තිබීම සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16

(i) භාවිතයට ගන්නා පිරිවැය රු.48,902,871 ක් වූ ශුද්ධ අගය ශූන්‍ය වන ජංගම නොවන වත්කම් ප්‍රත්‍යාගණනය කර සාධාරණ අගයන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) වත්කම්වල ක්ෂය අනුපාතය තීරණය කිරීමේදී එම වත්කමේ ඵලදායි ජීවිත කාලය පදනම් කර ගත යුතු වුවත් මෝටර් රථ ක්ෂය කිරීමේදී පාවිච්චි කළ කාලය පදනම් කර ගෙන අවුරුදු 10 ට අඩු මෝටර් රථ සඳහා සියයට 10 ක් හා අවුරුදු 10 ට වැඩි මෝටර් රථ සඳහා සියයට 20 ක් ලෙස ගණනය කර තිබුණි.

(iii) ප්‍රමිතිය අනුව ප්‍රත්‍යාගණන ලාභය අයිතිය දැක්වෙන ප්‍රකාශයේ දැක්විය යුතු අතර පසුව ඇතිවන ප්‍රත්‍යාගණන අලාභ එම ප්‍රත්‍යාගණන ලාභයට ගැළපිය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රත්‍යාගණන ලාභය වෙනම දක්වා නොමැති අතර සමාලෝචිත වර්ෂයේදී ප්‍රත්‍යාගණන අලාභ වශයෙන් රු.100,000 ක් විස්තීර්ණ නොවන ආදායම් යටතේ දක්වා නොතිබුණි.

(iv) අනෙකුත් උපකරණ සඳහා ක්ෂය අනුපාත ගිණුම් ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19

ප්‍රමිතිය අනුව සේවක ප්‍රතිලාභ බැඳීම් ගණනයේදී ව්‍යාපෘති ඒකක ණය ක්‍රමය භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20

මණ්ඩලයට වරින් වර රජයෙන් හා බාහිර පාර්ශවයන්ගෙන් ලැබී තිබූ එකතුව රු. 15,325,675 ක් වූ ප්‍රදාන හා ඒවායේ ක්‍රමක්ෂය අගය වූ රු. 3,866,736 ක මුදල ප්‍රාග්ධන හා සංචිත යටතේ පෙන්වා තිබුණි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 24

ප්‍රමිතිය අනුව සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ විස්තරාත්මක තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39

(i) 2012 වර්ෂයේ රු.122,822,417 ක් වූ හානිකරණ ප්‍රතිපාදනය 2013 හා 2014 වර්ෂ සඳහා කොටස් ආයෝජන සමාලෝචනය කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහාද එම ශේෂය ඉදිරියට ගෙනවිත් තිබුණි. පසුගිය වසර 07 ක කාල පරිච්ජේදය තුළ ලාභාංශ නොලැබුණු සමාගම්වල ආයෝජන වටිනාකම රු.25,750,000 ක් වූ බව තවදුරටත් නිරීක්ෂණය වූ අතර ඒ සඳහා හානිකරණ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව හිඟ හිටි අපනයන ණය ශේෂය රු.46,391,543 ක් වූ අතර ඉන් රු.45,477,591 ක් සඳහා හානිකරණ ප්‍රතිපාදන කර තිබුණි. අපනයන ණය අය කර ගැනීමේ ප්‍රගතිය සලකා බැලීමකින් තොරව 2012, 2013 හා 2014 වර්ෂවලදී හානිකරණය සඳහා සමාන ගණනක් ප්‍රතිපාදනය කර තිබුණ බැවින් හානිකරණය වූ සමාගම්වලින් අයකර ගත් රු.107,500 ක් ඉවත් කිරීම ගළපා නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන ස්වරූපයේ රු.218,559 ක් වූ වියදම්, අයහාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2013 වර්ෂයේදී උපචිත වියදම් යටතේ ප්‍රතිපාදනය නොකරන ලද එකතුව රු.7,357,040 ක් සමාලෝචිත වර්ෂයේදී උපචිත වියදම් ගිණුමට හර කර තිබූ අතර ප්‍රතිපාදනය කර සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු.3,988,213 ක් උපචිත වියදම් ගිණුමට හර කිරීම වෙනුවට අත්තිකාරම් ගිණුමට හර කර තිබුණි.

(ඇ) 2015 වර්ෂයේදී පැවැත්වීමට නියමිත වෙළඳ ප්‍රදර්ශන සඳහා පළ කරන ලද දැන්වීම් ගාස්තු වෙනුවෙන් රු.1,071,131 ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණ අතර එය සමාලෝචිත වර්ෂයේදී වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ධාරිතා සංවර්ධන වැඩසටහන යටතේ තේ නිෂ්පාදන සමාගම් දෙකකට රු.මිලියන 02 ක් ගෙවීමට මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී ගිවිසුම්වලට එළඹ තිබුණද මූල්‍ය ප්‍රකාශනවල ඒ වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඉ) නිලධාරීන්ගේ සේවා කාලය නිවැරදිව ගණනය නොකිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම් ගිණුමේ ශේෂය රු.231,561 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයේ ණය ගැති ගිණුමේ අසාමාන්‍ය බැර රු. 92,995ක් හා ණය හිමි ගිණුමේ අසාමාන්‍ය හර රු.10,528,683 ක් පැවති අතර එම ශේෂ හඳුනා ගෙන නිරවුල් කිරීමට හෝ ඒ සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) එකතුව රු.1,072,659 ක් වූ පෙර ගෙවීම් අදාළ වර්ෂවලදී වියදමට හර නොකර අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ලාභයට එරෙහිව කපා හැර තිබුණි.

(ඌ) එකතුව රු.80,984 ක අත්තිකාරම්වලට අදාළව සේවා සහ සැපයුම් නිම කර තිබියදී එම අත්තිකාරම් පියවා අදාළ වියදමට ගිණුම්ගත කිරීම වෙනුවට, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නොපියවූ අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(එ) අපනයන නිෂ්පාදන ගම්මාන සමාගම්වලින් ලැබිය යුතු ණය ශේෂයෙන් රු.53,581 ක් හා ලැබිය යුතු පොලිය රු.2,823,088 ක් වශයෙන් එකතුව රු. 2,876,669 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) අපනයන තත්ත්වයේ එළවළු අඛණ්ඩව නිෂ්පාදනය කිරීමේ අරමුණින් ඌව පරණගම ගම්මානය පදනම් කොට ගෙන ආරම්භ කර තිබූ නියමු ව්‍යාපෘතිය සඳහා ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදලින් රු.මිලියන 30 ක් ලබා දී තිබුණි. ඇණවුම් කළ පරිදි ආරක්ෂිත ගෘහ ඒකක නොලැබීම මත රු.මිලියන 25 ක් එම අරමුදලට ආපසු ගෙවා තිබුණ අතර තවදුරටත් ගෙවිය යුතු රු.මිලියන 5 සඳහා මූල්‍ය ප්‍රකාශනවල වෙන් කිරීමක් කර නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතිය යටතේ එක් ගොවියකු සඳහා රු.50,000 බැගින් ලබා දුන් රු.මිලියන 5 ක ණය මුදලෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.2,108,252 ක් අයකර ගෙන තිබුණි. එය ග්‍රාමීය ආර්ථික පුනර්ජීවන අරමුදලට ගෙවා නොතිබුණ අතර භාණ්ඩාගාරයට ගෙවිය යුතු මුදලක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඔ) 2012 මාර්තු 28 සිට 31 දක්වා පැවති ශ්‍රී ලංකා එක්ස්පෝ වෙළඳ ප්‍රදර්ශනයට අනුග්‍රාහකත්වය සැපයීමට එකඟ වූ විවිධ සමාගම් 5 කින් ලැබිය යුතු රු.මිලියන 2.5 ක මුදල අයකර ගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු කාර්යාලීය බදු කුලිය රු.516,495 ක් උපචිත කර නොතිබුණි.

### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ආයෝජන වටිනාකම රු.40,548,150 ක් වුවද උපලේඛන අනුව එම ශේෂය රු.31,698,150 ක් වුයෙන් රු.8,850,000 ක වෙනසක් විය.

(ආ) මණ්ඩලයේ නීති අංශයෙන් විගණනයට ඉදිරිපත් කළ අපනයන ණය ශේෂය හා මූල්‍ය ප්‍රකාශනයේ එම ශේෂය අතර රු.812,724 ක වෙනසක් වූ අතර ඒ සඳහා හේතු ඉදිරිපත් නොවීය.

### 2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

වටිනාකම රු.217,378,519 ක් වූ ජංගම වත්කම් හා රු.44,094,883 ක් වූ ජංගම වගකීම් සඳහා ශේෂ තහවුරු කිරීමේ ලිපි, උපලේඛන හා කාල විශ්ලේෂණද රු. 88,410,118 ක් වූ ආයෝජන සඳහා කොටස් සහතිකද විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

### 2.3 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ සේවයෙන් ඉවත් වූ නිලධාරියෙකුගෙන් 2006 වර්ෂයේ සිට මණ්ඩලයට අය විය යුතු රු.65,254 ක් හා හඳුනා නොගත් ණයගැතියකුගෙන් අයවිය යුතු රු.51,235 ක් වශයෙන් එකතුව රු.116,489 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ වැඩසටහන් සඳහා සැපයුම්කරුවන්ට ලබා දී ඇති රු.3,463,068 ක් වූ අත්තිකාරම් එම වැඩසටහන් අක්‍රියව තිබියදීත් මුදල් ආපසු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 ජනවාරි 09 දින සෝනි ඩිජිටල් වොයිෂ් රෙකෝඩර් එකක් මිල දී ගැනීම සඳහා පුද්ගලික ආයතනයකට ගිවිසුමකින් තොරව ලබා දුන් රු.16,000 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

(ඈ) කාර්යාලයීය උප බදු ගිවිසුම් අනුව අයවිය යුතු බදු කුලිය වූ රු.735,875 ක් මණ්ඩලය අය කර ගෙන නොතිබුණි.

### 2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුලී හිමිකරු සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව 2014 මාර්තු 15 සිට 2014 ඔක්තෝබර් 25 දක්වා මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය සඳහා මාසයකට රු.4,500,000 ක් බැගින් රු.31,500,000 ක කුලී මුදල් ගෙවා තිබුණි. තවද මහ කොළඹ තක්සේරු දෙපාර්තමේන්තුවේ පළාත් තක්සේරුකරුගේ අංක සීඑම්/සීඑම්සී/ආර්පී/102 හා 2014 ජූලි 21 දිනැති තක්සේරු වාර්තාව අනුව නව බදු කුලිය රු.500,000 කින් වැඩිවීම 2014 ජූලි 21 සිට ගෙවිය යුතු වුවත් 2014 අප්‍රේල් මස සිට ගෙවීම නිසා වැඩියෙන් ගෙවූ රු.2,000,000 මණ්ඩලය ආපසු අය කර ගෙන නොතිබුණි.

(ආ) දෙහිවල ගල්කිස්ස මහ නගර සභාවට අයත් ගොඩනැගිල්ලක මණ්ඩලයේ එක් ගබඩාවක් පවත්වා ගෙන යන අතර එම ආයතනය සමඟ ගිවිසුමකට එළඹීමකින් තොරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් බදු කුළිය රු.99,960 ක් ගෙවා තිබුණි. තවද මෙම ගොඩනැගිල්ලෙන් කොටසක් පුද්ගලික සමාගමකට උප බදු ලබා දී තිබුණද එම සමාගම සමඟද උප බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඇ) 1996 පෙබරවාරි 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව 1996 වර්ෂය තුළ අපනයන නිෂ්පාදන ගම්මාන 5 ක් ස්ථාපිත කිරීම සඳහා එක් අපනයන නිෂ්පාදන ගම්මානයකට උපරිමය රු.1,000,000 ක් සියයට 7 ක වාර්ෂික පොලියකට යටත්ව ණය මුදලක් ලබා දීමට මණ්ඩලය එකඟ වී තිබුණද ගිවිසුමකින් තොරව එක් අපනයන නිෂ්පාදන ගම්මාන සමාගමකට ලබා දී තිබු රු.2,493,310 ක ණය මුදලින් කිසිදු මුදලක් මේ වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද මෙම වැඩසටහන යටතේ ආධාර අනුමත කර නොතිබුණද සමාගම් දෙකකට ආපසු අය කර නොගන්නා ආධාර වශයෙන් රු.13,495,029 ක් ලබා දී තිබුණි.

## 2.5 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනත | |
| (i) 2(1) වගන්තිය | අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික සංවර්ධන සභාව 1992 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ වර්ෂ 22 ක් තුළදී රැස්වී නොතිබුණි. |
| (ii) 12(ට) වගන්තිය | මණ්ඩලය විසින් 1988 වර්ෂයේ සිට පෞද්ගලික සමාගම්වල රු.929,548,150 ක් ආයෝජනය කර තිබුණද ඒ සඳහා මුදල් ආමාත්‍යවරයාගෙන් අනුමැතිය ලබා ගෙන නොතිබුණි. අතිරික්ත මුදල් ආයෝජනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ කෙරෙහිද මණ්ඩලය විසින් අවධානය යොමු කර නොතිබුණි. |

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය

| | |
|---|---|
| XV පරිච්ඡේදයේ 10.1 වගන්තිය සහ 2007 සැප්තැම්බර් 11 දිනැති අංක 21/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | රටින් බැහැරවීම සඳහා අග්‍රාමාත්‍ය අනුමැතිය ලබා ගැනීමකින් තොරව නිලධාරින් 8 දෙනෙකු විදේශගත වී තිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 71 | පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සමගාමීව පැවැත්වූ වෙළඳ ප්‍රදර්ශනයේ සම්බන්ධීකරණ කටයුතු සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධාරියෙකුට 2013 සැප්තැම්බර් 24 දින සිට 2013 නොවැම්බර් 23 දින දක්වා රු.80,000 ක වැටුප් හා අනෙකුත් ප්‍රතිලාභ ගෙවා තිබුණද ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 104(1), 104(3), 104(4) සහ 110 | වාහන අනතුරු 5 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර අනතුර සිදු වූ දින සිට තුන් මාසයක් ඇතුළත පරීක්ෂණ පවත්වා ඊට වගකිව යුතු නිලධාරින් හඳුනාගෙන යෝජිත විනයානුකූල ක්‍රියාමාර්ග ඇතුළත් පරිපූර්ණ වාර්තාවක් පරීක්ෂණ කමිටුව විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ඉදිරිපත් කර නොතිබුණ අතර එම අනතුරු පිළිබඳ විස්තර ඇතුළත් හානි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 177 | එකතු කර ගන්නා රජයේ මුදල් දිනපතා බැංකුගත කළ යුතු වුවත් මණ්ඩලයට ලැබුණු රු.74,972 ක් මාස 02 ක කාලයක් ප්‍රමාද කිරීමෙන් අනතුරුව බැංකුගත කර තිබුණි. |

| | | |
|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 322(2) | නොගෙවූ වැටුප් රු. 24,390 ක් සහ මුදල් අයකැමි වෙත තිබූ රු.7,839 ක් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (v) | මුදල් රෙගුලාසි 371(2) (ආ), (ඇ) | එක් අවස්ථාවකදී ලබා දෙන තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 කට වැඩි නොවිය යුතු වුවත් මණ්ඩලය විසින් අවස්ථා 37 කදී එකතුව රු.1,563,500 ක් වූ අත්තිකාරම් මුදල් රෙගුලාසියට පටහැනිව ගෙවා තිබුණි. අත්තිකාරම් වශයෙන් ලබා ගත් මුළු මුදලම සහ අත්තිකාරම් දුන් මුදලෙන් සියයට 50 ට වැඩි ප්‍රමාණයක් නැවත පියවා තිබුණ අතර අදාළ නිළධාරීන් විසින් රු.88,490 ක මුදල් දින 06 සිට 27 දක්වා කාලයක් රඳවා ගෙන තිබුණි. |
| (vi) | මුදල් රෙගුලාසි 396 | නිකුත් කර මාස 06 කට වැඩි කාලයක් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ එකතුව රු.317,234 ක් වූ චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (vii) | මුදල් රෙගුලාසි 1645 | වාහනයේ ආරක්ෂාව සම්බන්ධයෙන් කෙරෙන වෙනස්කම් පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් ලොග් සටහන් පොත් පවත්වා ගත යුතු වුවත් මණ්ඩලය විසින් වාහන 31 කට අදාළව ලොග් සටහන් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (viii) | මුදල් රෙගුලාසි 1646 | වෙන්කළ වාහනවල මාසික සාරාංශ හා අනෙකුත් වාහනවල දෛනික ධාවන සටහන්වල මුල් පිටපත් අදාළ මාසය අවසාන වී ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර විගණකාධිපති වෙත එවිය යුතු වුවත් 2014 වර්ෂයේ දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ix) | මුදල් රෙගුලාසි 1647(ඉ) | වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ඇ) භාණ්ඩාගාර චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ii) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක එම්ඕඑෆ්පී/01/2010/01 දරන චක්‍රලේඛය | |
| • 5(i) වගන්තිය | අනියම් දීමනා ගෙවිය හැක්කේ විදේශ රජය හෝ ආයතනය නොගෙවන අවස්ථාවකදී දරනු ලබන ගමන් වියදම්, ගුවන්තොටුපල ගාස්තු, වීසා ගාස්තු යනාදිය පියවා ගැනීමට වුවත් විදේශ ගමන් සඳහා අදාළ විදේශීය අනුග්‍රාහක ආයතන එම වියදම් වෙනුවෙන් අනුග්‍රහය දරා තිබියදීත් මණ්ඩලය විසින්ද නිලධාරීන් 5 දෙනෙකුට අනියම් දීමනා ලෙස රු.286,597 ක් ගෙවා තිබුණි. |
| • 06 (i) වගන්තිය | විදේශ ගමන් සඳහා සංයුක්ත දීමනා ගෙවීමේදී චක්‍රලේඛය ප්‍රකාරව දෙවන කාණ්ඩයට යටත්ව ගෙවිය යුතු නිලධාරීන් 6 දෙනෙකුට 2013 හා 2014 වර්ෂවලදී පළමු කාණ්ඩය යටතේ සංයුක්ත දීමනා ගෙවීම නිසා පිළිවෙලින් රු.448,622 ක් හා රු.250,728 ක් වැඩිපුර ගෙවා තිබුණි. |

(ඉ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2001 පෙබරවාරි 28 දිනැති අංක පීඑෆ්/පීඊ 14 දරන චක්‍රලේඛයේ vii වගන්තිය | රැස්වීම්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීමට රජයේ ආයතනවල පහසුකම් තිබියදීත් එවැනි වැඩසටහන් හෝටල්වල පවත්වා රු.83,600 ක මුදලක් හෝටල් ගාස්තු වශයෙන් ගෙවා තිබුණි. |
| (ii) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග වෙනුවෙන් වෙනම වත්කම් ලේඛන පැවැත්විය යුතු වුවද, වටිනාකම රු.37,066,961 ක් වූ පරිගණක හා උපාංග වෙනුවෙන් එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |

| | |
|---|---|
| (iii) 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන චක්‍රලේඛය | |
| • 02 හා 03 වගන්ති | නියමිත දින වකවානු තුළ මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි භාණ්ඩ සමීක්ෂණ සිදු කර වාර්තාවක් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| • 3.5 වගන්තිය | 2013 භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ නිර්දේශය නොමැතිව භාණ්ඩ අයිතම් 258 ක් වෙන්දේසි කර තිබුණි. |
| (ඊ) 2010 සැප්තැම්බර් 06 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) ඡේදය | මණ්ඩලයේ වාහනයක් අලුත්වැඩියා කිරීම සඳහා පුද්ගලික සමාගමකට රු.274,902 ක් ගෙවා තිබුණද ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (උ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.3 ඡේදය | අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ එදිනට අයවැයගත ශේෂ පත්‍රය ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඌ) 2003 ඔක්තෝබර් 06 දිනැති අංක එන්පී/3 දරන ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | නව ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර ව්‍යාපෘතියට අදාළ යෝජනාව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතු වුවද මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කළ රු.මිලියන 21.3 ක් වූ ව්‍යාපෘති 2 ක් සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (එ) 2011 පෙබරවාරි 11 දිනැති අංක 57 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 2 ඡේදය | රාජ්‍ය ව්‍යාපාර විසින් සිදුකරනු ලබන ප්‍රවාරණ වැඩසටහන්, නියමානුකූලව සැකසූ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් යුක්තව එහි අරමුණු, පිරිවැය, ප්‍රතිඵල මත පදනම්ව ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කළ යුතු වුවත් ප්‍රවාරණ හා අනුග්‍රාහක |

ප්‍රවාරණ දැන්වීම් සඳහා රු.6,776,430 ක් වැය කර තිබුණද 2014 ක්‍රියාකාරි සැලැස්ම තුළ ඒවා පැහැදිලිව හඳුනාගත හැකිවන පරිදි ඇතුළත් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.105,651,865 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.100,514,844 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,137,021 ක වාසිදායක වර්ධනයක් නිරීක්ෂණය විය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අපනයන ප්‍රවර්ධන වැඩසටහන් යටතේ විදේශ වෙළඳ ප්‍රදර්ශන නියැදියක් පරීක්ෂාවේදී ප්‍රදර්ශන 5 ක් සඳහා අපනයනකරුවන් 143 දෙනෙකු සහභාගි කරවා රු.9,702,584 ක් වැයකර තිබුණද අපනයන ප්‍රවර්ධනයට ඔවුන්ගෙන් දායක වී තිබුණේ අපනයනකරුවන් 17 දෙනෙකු පමණි. මේ අනුව අපනයන ආදායම වර්ධනය කිරීමෙහිලා, විදේශ වෙළඳපල ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගි කරවීම ඵලදායී අන්දමින් සිදු වී නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුවට සමගාමීව පැවැත් වූ වෙළඳ ප්‍රදර්ශනය සඳහා සන්නිවේදන ආයතනයක් රු.මිලියන 5 ක දායකත්වයක් සැපයීමට එකඟ වී ඇති නමුත් ලිඛිත ගිවිසුමක් හෝ අනුග්‍රාහය සපයන බවට සහතික වීමක් ලබා ගෙන නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට රු.මිලියන 2.5 ක මුදලක් අයකර ගැනීමට නොහැකි වී ඇත. තවද මෙම වෙළඳ ප්‍රදර්ශනයට අනුග්‍රාහකත්වය සැපයූ ආයතන සඳහා වෙළඳ කුටි හා ප්‍රවාරක වැඩසටහන් සඳහා ඉඩ පහසුකම් නොමිලයේ සපයා දී තිබුණද අනුග්‍රාහකයන්ට සැපයිය යුතු පහසුකම් හෝ කොන්දේසි මොනවාද යන්න පිළිබඳ මණ්ඩලයේ අවධානය යොමු වී නොතිබුණි.

(ආ) ආයෝජන

(i) සමාලෝචිත වර්ෂයේ විසුරුවා හැර ඇති සමාගම් 3 ක සාමාන්‍ය කොටස්වල ආයෝජන වටිනාකම වූ රු.17,315,000 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) නව සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි නොකිරීම මත සමාගම් ලේඛනයෙන් නම ඉවත් කර තිබූ සමාගම් 16 ක වරණීය කොටස් වටිනාකම රු.34,591,428 ක් සහ සමාගම් 17 ක සාමාන්‍ය කොටස් වටිනාකම රු.5,132,890 ක් වූ ආයෝජන උපලබ්ධි කර ගැනීම සඳහා මණ්ඩලය විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි.

(ඇ) අපනයන සමාගම්වල මූල්‍ය ශක්තිය වැඩිදියුණු කිරීමේ අරමුණින් 1983 සිට 1999 දක්වා කාලපරිච්ඡේදය තුළ ආරම්භ කළ ණය වැඩසටහන යටතේ අපනයන සමාගම් 166 කට ලබා දී තිබූ රු.59,659,978 ක් වූ ණය මුදලින් රු.13,268,435 ක් 2006 සිට 2014 දක්වා කාලය තුළ අය කර ගෙන තිබුණු අතර 2005 දෙසැම්බර් 31 දිනට අපනයන සමාගම් 139 කින් අයවිය යුතු එකතුව රු.33,116,208 ක් වූ හිඟ හිටි ණය අයකර ගැනීම සඳහා මේ දක්වා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. මණ්ඩලය විසින් නෛතික ක්‍රියාමාර්ග නියමිත දිනවලදී නොගැනීම සහ නෛතික ක්‍රියාමාර්ග ගෙන තිබූ සමාගම්වලින් ණය ආපසු අයකර ගැනීමේ ප්‍රගතිය පිළිබඳ පසු විපරම් නොකිරීම නිසා අය නොවී පවතින ණය ශේෂයේ කාල විශ්ලේෂණය වසර 15 ත් 20 ත් අතර පවතින බව නිරීක්ෂණය විය.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012, 2013 සහ 2014 වර්ෂවල ක්‍රියාකාරී සැලැස්මෙන් හා අයවැය ලේඛනයෙන් අනුමත නොවූ කුසලතා සංවර්ධන වැඩසටහන යටතේ පුහුණු කළ යුතු ව්‍යවසායකයින් ගණන, ව්‍යවසායකයින් තෝරා ගැනීමේ පදනම, පුහුණු ක්ෂේත්‍රය සහ කාලය පිළිබඳව පූර්ව හඳුනා ගැනීමක් නොමැතිව හා ගිවිසුමකින් තොරව 2011 ඔක්තෝබර් 25 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයක් අනුව ව්‍යවසායකින් පුහුණු කරවීම සඳහා ජාතික තරුණ සේවා සභාවට පවරා තිබුණි. මන්නාරම දිස්ත්‍රික් ලේකම්වරයා වෙත 2014 අප්‍රේල් 22 නිකුත් කළ රු.845,000 ක් වූ අත්තිකාරම් මුදල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් පුද්ගලික රියදුරු පුහුණු ආයතනයක් වෙත ඍජුව නිකුත් කර තිබූ හෙයින් ජාතික තරුණ සේවා සභාව සම්බන්ධ කර ගැනීමෙන් ලබා ගැනීමට බලාපොරොත්තු වූ පුහුණුවීම් මොනවාද, පුද්ගලික රියදුරු පුහුණු ආයතනයක් හරහා ලබා දෙන අපනයන ක්ෂේත්‍රය සම්බන්ධිත වූ පුහුණුව කවරෙක්ද යන්න විගණනයට අපැහැදිලි විය.

තවද ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතිය කුමක්ද යන්න අදාළ දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් වී නොමැති නිසා රු.3,575,000 ක් වූ අත්තිකාරම් මුදල් වැය නොකර අදාළ දිස්ත්‍රික් ලේකම්ගේ පොදු තැන්පත් ගිණුමෙහි නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2012 මාර්තු 28 හා 31 දිනවල පැවැත්වූ එක්ස්පෝ 2012 වෙළඳ ප්‍රදර්ශනය පිළිබඳව බණ්ඩාරනායක ගුවන් තොටුපලෙහි නඩත්තු කරන ලද එල්ඊඩී ප්‍රදර්ශන පුවරුව එම ප්‍රදර්ශනය අවසන් වීමෙන් පසුවද ගිවිසුම් කාලය දීර්ඝ කරමින් සමාලෝචිත වර්ෂය වන විටද නඩත්තු කර තිබුණි. මෙම පුවරුව සඳහා 2013 ජනවාරි - සැප්තැම්බර් කාලය සඳහා ගිවිසුම්ගත මුදලට වඩා රු.73,049 ක් වැඩියෙන් ගෙවීම් කර තිබුණි. තවද 2011- 2014 කාලය තුළ මාස 15 ක් එම පුවරුවේ කිසිම ප්‍රචාරණයක් කර නොතිබුණු බැවින් මෙම ප්‍රචාරණය තුළින් මණ්ඩලය බලාපොරොත්තු වන අරමුණු ඉටු වී නොමැති බව හෝ එම ප්‍රචාරණය අවශ්‍යතාවයක් නොමැති බව තවදුරටත් නිරීක්ෂණය විය.

### 4.4 දෘශ්‍ය අක්‍රමිකතා

--------------------

මණ්ඩලය ලබා ගෙන තිබූ ආරක්ෂක සේවයේ ස්ථාන භාර නිලධාරි සහ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි වෙනත් ආරක්ෂක තනතුරු දෙකක රාජකාරි කළ බවට ව්‍යාජ අත්සන් යොදා 2014 ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා රු.226,530ක් වැටුප් ලබා ගෙන තිබුණද එම වැටුප ආපසු අය කර ගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

### 4.5 අරමුණුවලින් බැහැර ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්මේ ඇති බව සඳහන් කරමින් අපනයන වෙළඳපොළට මිරිස් සැපයීම අරමුණු කර ගෙන වවුනියාව හා මන්නාරම දිස්ත්‍රික්කයන්හි මිරිස් වගා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට රු.මිලියන 15 ක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර තිබුණි. එම මුදල ඉක්මවා රු.මිලියන 22.7 ක් වැය කරමින් අක්කර 50 ක ආරම්භ කළ මිරිස් වගා ව්‍යාපෘතියෙන් මේ දක්වා අපනයන වෙළඳ පොළට කිසිදු අපනයනයක් සිදු කර නොතිබුණි. මණ්ඩලය අපනයන ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් තුළින් මණ්ඩලයේ අරමුණුවලට පටහැනිව කෘෂිකාර්මික කටයුතුවල නියැලී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල - 2018 හම්බන්තොට වෙනුවෙන් ලංසු ඉදිරිපත් කිරීම, ශ්‍රී ලංකාව තුළ ක්‍රීඩා ප්‍රවර්ධනය, ජාතික හා අන්තර් ජාතික මට්ටමේ ක්‍රීඩා ඉසව් සංවිධානය හා ක්‍රීඩා පුහුණු පහසුකම්වල ආයෝජනය යනාදී අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පිහිට වූ පුද්ගලික සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙහි මණ්ඩලය විසින් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව රු.මිලියන 8 ක් ආයෝජනය කර තිබුණද ඒ සඳහා ප්‍රතිලාභ ලබා ගෙන නොතිබුණි.

(ඇ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ බලතල හා කර්තව්‍යයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී රු. 4,020,848 ක වියදම් දරා තිබුණි.

## 4.6 නිෂ්ක්‍රීය වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාවිතයට නොගන්නා කාර්යාල උපකරණ හා පරිගණක උපාංග අයිතම් 8ක් 2009 වර්ෂයේ සිටද වාහන අමතර කොටස් 27 ක් 2011 වර්ෂයේ සිටද නිෂ්ක්‍රීයව පැවතුනද ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් පවත්වනු ලබන ප්‍රදර්ශන වැඩසටහන් සහ වැඩමුළු සඳහා නිසි කළමනාකරණයකින් තොරව ලිපි ලේඛන මිලදී ගැනීම හා මුද්‍රණය කිරීම නිසා රු.1,301,922 ක තොග හා මණ්ඩලයේ පරිහරණය සඳහා 2008 වර්ෂයේ සිට මිලදී ගනු ලැබූ ලිපි ද්‍රව්‍ය අයිතම් 54 ක් කිසිදු ප්‍රයෝජනයකින් තොරව ගබඩා කර තිබුණි.

## 4.7 ආර්ථික නොවූ ගනුදෙනු

සමාගම් 30 ක වරණීය කොටස්හි කළ රු.105,058,084 ක් වූ ආයෝජන සඳහා 1997–2014 කාලපරිච්ඡේදයට සහ සමාගම් 31 ක සාමාන්‍ය කොටස්වල කළ රු.43,494,334 ක් වූ ආයෝජන සඳහා 2001-2014 කාලපරිච්ඡේදයට අදාළව ලාභාංශ ලැබී නොතිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 282 ක් හා 223 ක් වූයෙන් පුරප්පාඩු සංඛ්‍යාව 59 ක් විය. එසේම කොන්ත්‍රාත් පදනම මත 4 දෙනෙකු බඳවා ගෙන තිබුණද ඒ සඳහා අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

## 4.9 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් මණ්ඩලයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 වගන්තියට පටහැනිව මණ්ඩලයට අයත් වාහන 5 ක් සහ නිලධාරීන් 4 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවයට යොදවා සමාලෝචිත වර්ෂයේදී වාහන නඩත්තු වියදම් සහ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස පිළිවෙලින් රු.1,593,229 ක් හා රු.1,231,027 ක් වශයෙන් එකතුව රු.2,824,256 ක් මණ්ඩලය විසින් දරා තිබුණි.

## 4.10 වාහන උපයෝජනය

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.5(අ) වගන්තිය අනුව රාජ්‍ය සංස්ථාවක වෙන් කළ පදනමින් වාහන පාවිච්චි කිරීම සභාපතිවරයාට, අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විධායක අධ්‍යක්ෂ වෙත පමණක් සීමා කර තිබුණද එයට පටහැනිව මණ්ඩලයේ අධ්‍යක්ෂ තනතුරු දරන නිලධාරීන් වෙත නිවස හා රාජකාරී ස්ථානය වෙත යාමටත් පෞද්ගලික ගමන් සඳහාත් නිල වාහන ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී ඉන්ධන වෙනුවෙන් රු. 3,192,029 ක් වැය කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

## 5.1 අභ්‍යන්තර විගණනය

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ වගන්ති 7 සහ 9 අනුව අභ්‍යන්තර විගණන වැඩසටහන් සහ විගණන සැලැස්ම සකස් කර නොතිබුණ අතර, විගණන කටයුතු ක්‍රියාත්මක කිරීම දුර්වල තත්ත්වයක පැවතිණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් 6 ක් නිකුත් කර තිබුණද එම විමසුම්වලින් වාර්තා කර තිබුණු අඩුපාඩු සම්බන්ධයෙන් ද මණ්ඩලයේ අවධානය යොමුකර නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

පසුගිය විගණන වාර්තාවලින් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

| 2013 වර්ෂයේ විගණන ඡේදයට යොමුව | විගණන ඡේදයේ සාරාංශය |
|---|---|
| (අ) ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු | (i) බදු කාලය දීර්ඝ කිරීමක් හෝ නව ගිවිසුමකට එළඹීමකින් තොරව 2013 අගෝස්තු 01 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා බදු කුලී වශයෙන් රු.841,000 ක් ගෙවා තිබුණි. |
| | (ii) ජාතික සවිය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු.1,009,740 ක් එම කාර්යාලයෙන් තහවුරු කර ගැනීමකින් තොරව සහ විධිමත් අනුමැතියකින් තොරව ආදායමට බැර කර තිබුණි. |
| (ආ) නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම | |
| (i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 3.5 වගන්තිය | යතුරු පැදි ණය හා ආපදා ණය දීමේදී මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව මාසික වැටුපෙන් සියයට 50 ක් ලෙස සලකා ලබාදී තිබුණි. |
| (ii) 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛය | මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබා නොගෙන වර්ෂ 05 ක කාලයක් සඳහා බදු කුළී පදනම මත වාහන 04 ක් සඳහා 2013 දෙසැම්බර් 31 දින වන විට රු.10,051,179 ක් බදු කුළී වශයෙන් ගෙවා තිබුණි. |

19

| | |
|---|---|
| (iii) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 වගන්තිය | මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට මාසිකව රු.5,500 ක්ද අනෙකුත් සේවකයින්ට දෛනිකව රු.164 ක උපරිමයකට යටත්ව 2013 වර්ෂයේ ගෙවා තිබුණු ප්‍රවාහන දීමනාව රු.5,004,963 ක් විය. |
| (ඇ) කළමනාකරණ අකාර්යක්ෂමතා | ඉන්දියාවේ චෙන්නායි නුවර 2004-2009 කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබූ ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 5 කින් අය විය යුතු හිඟ කුලී හා විදුලි ගාස්තු රු.7,049,858 ක් 2014 ජුනි 30 වන විටත් අය කර ගෙන නොතිබුණි. |

**2012 වර්ෂයේ විගණන ඡේදයට යොමුව**

---

| | |
|---|---|
| (ඇ) ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු | 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතට පටහැනිව පත් කර තිබූ විධායක අධ්‍යක්ෂවරයෙකුට 2012 දෙසැම්බර් 31 දිනට මාසික දීමනා, ඉන්ධන දීමනා හා දුරකථන ගාස්තු වශයෙන් එකතුව රු.1,557,337 ක් මණ්ඩලයේ අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඉ) හඳුනාගත් පාඩු | "හම්බන්තොට බටඅත" කර්මාන්ත වැඩසටහනේ සම්භාණ්ඩ කර්මාන්ත ව්‍යාපෘතිය සඳහා රු.1,000,000 ක් ආයෝජනය කර ස්ථාපිත කළ පුද්ගලික සමාගමේ කටයුතු ආරම්භ කිරීම අත්හැර දමා තිබුණු බැවින්, ආයෝජනය කළ මුදල් මණ්ඩලයට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

6. පද්ධති හා පාලනයන්

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ .

(අ) ගිණුම්කරණය

(ආ) ආයෝජන

(ඇ) ණය ආපසු අයකර ගැනීම

(ඈ) හිඟහිටි ආදායම්

(ඉ) වත්කම් පාලනය

(ඊ) වෙළඳ ප්‍රදර්ශන

(උ) අයවැය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)